# මාසික මහ සභා රැස්වීම - 2022/03/08 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/03/08වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 48 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තැව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම් නිහාල් ඒකනායක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 48 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් , අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. 2022/02/08දින මහ සභා වාර්තාව ස්ථිර කිරිම.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022.02.08දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරිමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.02.08 දින පැවති VI වන සැසිවාරයේ 47 වන මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>

**<u>2022.02.08 දින මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>**

i. සභා වාර්තාවේ 09 වන පිටුවේ අංක 03.04 ස්ථාවර වත්කම් තහවුරු කර ගැනීම සඳහා යන ලිපිය යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ ඇතුලත් "ඊට ප්‍රථමව එවකට ගම් සභා සභාපතිව සිටි වෛද්‍යාරත්න මහතාත්, පී.බී. වැත්තැව මැතිතුමාත් මැදිහත් වී මෙම ඉඩම කැප්පිටිවලාන උප කාර්යාලයට ලබා ගනු ලැබුවා." යන ප්‍රකාශය "ඊට ප්‍රථමව එවකට ගම් සභා සභාපතිව සිටි වෛද්‍යාරත්න මහතාත්, **මහජන මන්ත්‍රීවරයා ලෙස** පී.බී. වැත්තැව මැතිතුමාත් මැදිහත් වී මෙම ඉඩම කැප්පිටිවලාන උප කාර්යාලයට ලබා ගනු ලැබුවා." ලෙස සංශෝධනය විය යුතුය.

ii. සභා වාර්තාවේ 09 වන පිටුවේ අංක 05.04 යෝජනාව යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ ඇතුලත් "ඔබතුමිය පොදුජන එක්සත් පෙරමුණෙන් නවක මන්ත්‍රීවරියක් ලෙසත් 1998 මැතිවරණයට ඉදිරිපත් වුනා. නවක මන්ත්‍රීවරියක් වුවත් මනාප 1483 ක් ලබා ගෙන වාර්තාගත ජයග්‍රහණයක් අත් කර ගෙන සභාපති ධූරයට පත් වුනා." යන ප්‍රකාශය "ඔබතුමිය පොදුජන එක්සත් පෙරමුණෙන් නවක මන්ත්‍රීවරියක් ලෙසත් **1997** මැතිවරණයට ඉදිරිපත් වුනා. නවක මන්ත්‍රීවරියක් වුවත් මනාප **14083** ක් ලබා ගෙන වාර්තාගත ජයග්‍රහණයක් අත් කර ගෙන සභාපති ධූරයට පත් වුනා." ලෙස සංශෝධනය විය යුතුය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සභා වාර්තාවේ 27 පිටුවේ 5.10 යෝජනාව යටතේ 2022 අයවැය යෝජනා මගින් මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන යටතේ ලක්ෂ 07 ක සංවර්ධන යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අප දන්නා ආකාරයට නම් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ලබා දෙන්නේ ලක්ෂ 05 ක ප්‍රතිපාදනයකුයි. මේ අනුව එක් මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 07 ක සංවර්ධන යෝජනා ඉදිරිපත් කල හැකි දැයි දැනගැනීමට කැමතියි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2022 අයවැය යටතේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ලබා දෙන්නේ ලක්ෂ 05 ක ප්‍රතිපාදනයකුයි. එම නිසා එතුමා ඉදිරිපත් කර ඇති යෝජනා ලක්ෂ 05 කට නැවත සංශෝධනය කර දෙන ලෙස අදාල මන්ත්‍රීතුමාව දැනුවත් කරන්නම්.

ඒ අනුව, 2022.02.08 දින පැවති VI වන සැසිවාරයේ 47 වන මහ සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

## 02.ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන

### 02.1

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අද ලෝක කාන්තා දිනයයි. මෙම කාන්තා දිනය වෙනුවෙන් අපේ සභාවේ උතුම් සමාජ මෙහෙවරක් කරනු ලබන මන්ත්‍රීතුමියන්ලාට මගේ ගෞරවය පුද කර සිටිනවා. එමෙන්ම මෙම ගරු මන්ත්‍රීතුමන්ලාව මෙලොවට බිහි කල සමාජයට යහපතක් කරන පුද්ගලයින් ලෙසට හැඩගැස්වූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ මෑණිවරුන්ට ද, එමෙන්ම ඔබතුමන්ලාට ගෙදරදොර සහයෝගය ශක්තිය ලබා දෙන බිරින්දෑවරුන්ට ද මගේ ගෞරවය පුදකරනවා. එමෙන්ම අපගේ සේවය ජනතාව වෙත ලබා දීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන අපේ ලේකම්තුමිය ප්‍රධාන අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරී මහත්මීන්ටද මෙම කාන්තා දිනයේදී බල ප්‍රදේශය වෙනුවෙන් මගේ ගෞරවය පුද කර සිටිනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි සියළු දෙනාම මෙලොව එළිය දුටුවේ මවකගේ කුසිනුයි. බුදුරජාණන් වහන්සේ බුදු වීමටත් මවගේ නියත විවරණ ලැබුවා. දරුවෙකුට මව තරම් උතුම් වස්තුවක් නැහැ. දරු සෙනෙහස දෙන එම උත්තම කාන්තාව වන සෑම මවකටම ගෞරවය හිමිවිය යුතුයි. කාන්තාවට ගෞරවනීය තත්වයක් උදාකර දී අද දිනය ලෝක කාන්තා දිනය ලෙස නම් කිරීම ඉතා අගය කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔබතුමිය ඇතුළු සියළුම මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරිණියන්ටත් මෙම කාන්තා දිනයේදී හදවතින්ම සුභ පතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම කාන්තා දිනයේදී මුළු ලෝකයේම කාන්තාවන්ට සුභ පතනවා. කාන්තාව උතුම් වස්තුවක්. සෑම කෙනෙකුටම ජීවය ලබා දෙන්නේ මවක් විසිනුයි. අද වන විට කාන්තාව බොහෝ අවස්ථා වලදී මෙන්ම බොහෝ ආයතන වල මූලිකත්වය ගෙන කටයුතු කරනු දක්නට ලැබෙනවා. ලෝකයේ බොහෝ කාන්තාවන් තමන්ගේ පවුල රැකගැනීමට නොයෙක් දුක් ගැහැට විඳිනවා. කාන්තාවට අද පමණක් නොව මෙලොව පවතින තාක් කල් ගෞරව උපහාර පුදකල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ලෝක කාන්තා දිනයේදී සියළුම කාන්තාවන්ට හදවතින්ම සුභ පතනවා. මේ ලෝකය ආරම්භ වන්නේ මවගෙනුයි. එම උත්තරීතර මාතෘත්වයට අපි ගෞරවය පුදකල යුතුයි. අද සමාජයේ ඉදිරි පෙලේ සිටින්නේ කාන්තාවයි. කාන්තාවට හිමි තැන ලබා දීම අපගේ යුතුකමයි. කාන්තා හිංසනය පිටුදැකිය යුතුයි. ලෝකයේ ප්‍රථම අගමැතිණිය වන අප රටේ සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනිය, බ්‍රිතාන්‍යයේ මාග්‍රට් තැචර් වැනි කාන්තාවන් පාලන තන්ත්‍ර වල බොහෝ ඉදිරියට ගිය කාන්තාවනුයි. ඒ අනුව කාන්තාවන්ට ගෞරවය හිමි කර දිය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කාන්තා දිනය ලෙස දිනයක් වෙන් කර එදිනට පමණක් කාන්තාව ඇගයීමට ලක් වෙනවා. නමුත් දයාබර මවක්, බිරිඳක්, සහෝදරියක්, යෙහෙළියක්, දියණියක් ලෙස අගය කරන සෑම නිවසකම කාන්තාව හැමදාමත් ඇගයීමට ලක් වෙනවා. අපි සියළු දෙනාම කාන්තාව කෙරෙහි තිබෙන ගෞරවය සහ වගකීම සිතේ දරාගෙන පිරිමින් ලෙස කටයුතු

කරනවා නම් කාන්තාවට සෑම දිනක්ම කාන්තා දිනයක් වනවා. විශේෂයෙන්ම කාන්තාවක් ලෙස බාධක රැසකට මුහුණ දී තමන්ගේ භූමිකාව තුල බොහොම ඉවසිලිවන්තව සහ ආත්ම ශක්තියෙන් යුතුව සියළු දේ ට මුහුණ දීම සම්බන්ධයෙන් අපි ඔබතුමියටත් ගෞරවය පුදකරනවා. ඒ අනුව ඔබතුමියටත් ලේකම්තුමිය ඇතුළු සහෝදර නිලධාරීන්ටත්, විපක්ෂයක් ලෙස සුභාසිංශන පුදකරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,ජාත්‍යන්තර කාන්තා දිනය යෙදී තිබෙන අද දවසේ මාගේ මව ඇතුළු සියළු කාන්තාවන් හට මගේ ගෞරවය පුදකරනවා. අද වන විට මව මුළුතුන්ගෙයි හි බොහොම පීඩනයට පත් වූ කාන්තාවක් බවට පත් වී තිබෙනවා. මෙම අම්මාවරුන්ව එයින් ගලවා ගැනීමට එක් දිනක් වෙන් කිරීම ප්‍රමාණවත් වන්නේ නැහැ. කාන්තාවට නිසි තැන හිමි කර දිය යුතුයි. දැඩි නීති ක්‍රියාත්මක කිරීමෙන් හෝ කාන්තාව පීඩනයට ලක් වීම නැවැත්විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි,ලෝක කාන්තා දිනයේදී සමස්ථ ලෝකවාසී කාන්තාවන්ට සුභපැතුම් එක් කරනවා. නොයෙක් බාධක පීඩා මැද තම පවුල රජ කරවන්නට දිරිය දෙන්නේ දිරිය කාන්තාවනුයි. සමාජය දිනවීමටත් උර දෙන්නේ කාන්තාවනුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,ලෝකවාසී සියළුම කාන්තාවන්ට කාන්තා දිනයේදී සුභාසිංශන පතනවා. කුමන තරාතිරමක කාන්තාවක් වුවත් ඔවුන්ට ගරු කිරීම උතුම් දෙයක්. සෑම තැනකම කාන්තාවන්ට මුල් තැන ලැබී තිබෙන්නේ ඔවුන්ගේ දක්ෂතාවය, නිර්මාණශීලීත්වය නිසයි. කාන්තාවන්ට ලැබිය යුතු ගෞරවය ඒ ආකාරයෙන්ම ලබා දෙනවා නම් ඕනෑම රටක් ලස්සන වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි සියළු දෙනාම මෙලොව ජනිත වූයේ කාන්තාවකගෙනුයි. මව්වරුන් ප්‍රමුඛ සමස්ත කාන්තා පරපුරටම අපේ උත්තමාචාරය පුදකල යුතුයි. ලෝකයේ යම් යම් වාර්තා තැබූ කාන්තාවන් සිටිනවා. අපේ සභා ඉතිහාසය දෙස බැලූ විට ඔබතුමියත් ප්‍රථම සභාපතිනිය ලෙස අපේ සභා ඉතිහාසයට වාර්තාවක් එක් කර තිබෙනවා. සෑම ආයතනයක්ම ගත් විට ඉහළ පුටු වල සිටින්නේ කාන්තාවනුයි. බුදු දහමත් සමඟ මුළු ගැන්වී සිටින කාන්තාවන්ට ගෞරවය හිමි වුනා . අද වන විට කාන්තාවන්ට නිසි තැන නිතැතින්ම හිමි වී තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, ලංකාවාසී සහ ලෝකවාසී කාන්තාවන්ට අභිමානනීය දිනයක් ප්‍රාර්ථනා කරනවා. කාන්තාවක් ලෙස නියෝජනය කරනු ලබන විවිධ භූමිකා තුලින් ලබා ගන්නා පන්නරය කාන්තාව තුල ඉවසීම කැපවීම ආදී ශක්තීන් ඇතිකරනු ලබනවා. අපේ සභාවේ මුල් පුටුවේ සිටින්නේත් අභිමානවත් කාන්තාවක්. නිවසක් තුල මවක්, බිරිඳක් ලෙස දැවැන්ත රාජකාරියක් කාන්තාව විසින් ඉටු කරනු ලබනවා. නමුත් එය ඇගයීමට ලක් වෙන්නේ ඉතා අල්ප වශයෙනුයි. එම නිසා මෙවැනි දිනයක් වෙන් කර ඇගයීමට ලක් කිරීමෙන් එය කාන්තාවට දැනෙනවා. ආයතන වල ඉහළ තනතුරු වල සිටින කාන්තාවන්ට වගේම නගරය පිරිසිදු කරන කාන්තාවන්, සිඟමන් යදින කාන්තාවන් ආදී සියළුම කාන්තාවන්ට උපහාරය හිමි විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, අද අපිට එක් දිනයක හෝ අභිමානයෙන් කතා කිරීමට ලැබීම සතුටක්. කුමන ආයතනයක බැලුවත් මුල් පුටු වල සිටින්නේ කාන්තාවනුයි. කාන්තාවන් කුමක් හෝ දෙයක් ඉගෙන ගැනීමට පෙළඹෙනවා. කාන්තාව සෑම විටම කටයුතු කරනු ලබන්නේ පිරිමියාට මුල්තැන ලබා දීලයි. රටේ තිබෙන සෑම රැකියාවකම මුල්තැන ගෙන කටයුතු කිරීමට හැකි දක්ෂතා තිබෙන බුද්ධිමත් කාන්තාවන් අද සමාජයේ සිටිනවා. කාන්තාවන් ඉහළ නිලතල හොබවන ආයතන වල හොර මැර වංචා දූෂණ දක්නට ලැබෙන්නේ නෑ. අපේ සභාවේ මුල් පුටුවේ සිටින්නේ එවැනි කාන්තාවකුයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් ගිය ආණ්ඩුව සමයේ 25% ක කාන්තා නියෝජනයක් ලබා දුන්නා. අපි අද මෙතන සිටින්නේ එම නිසයි. අද කාන්තා දිනයේ මගේ කොට්ඨාශයේ නිවසක් නොමැති පවුලකට නිවසක් සාදා දීමට මම තීරණය කලා. ඒ සඳහා මට සහයෝගය ලබාදෙන ලෙස ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අද කාන්තා දිනයේ ඔබ සියළු දෙනා කාන්තාව අගයා කතා කිරීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.අපිට මෙසේ කාන්තාව පිළිබඳව කතාකිරීමට අවස්තාව උදා වී තිබෙන්නේ කාන්තා දිනයක් වෙන් කල නිසයි.

**02.2 - ජාතික යුතුකමක් ඉටුකරමු**

රටේ සමස්ත විදුලි උත්පාදනයෙන් 30% කට දායකත්වයක් සපයන ජල විදුලි බලාගාර පවතින වැසි රහිත කාලගුණ තත්වය හේතුවෙන් මුළුමනින්ම අක්‍රිය තත්වයට පත්ව ඇති අතර එම අඩුව පිරවීම සඳහා ඩීසල් සහ දැවි තෙල් බලාගාර මගින් විදුලිය උත්පාදනය කිරීම සඳහා ද මේ මොහොත වන විට ලෝක වෙළඳපලේ තෙල් මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති බැවින් අභියෝගාත්මක තත්වයකට මුහුණ දීමට සිදු වී ඇති බවත් මෙය කළමණාකරණය කිරීමේ ප්‍රමුඛ විකල්පයක් වන්නේ විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම වන බැවින් එකී ආදර්ශය සමාජගත කරමින් විදුලිය පිරිමැසීම සඳහා මාර්තු 31 වෙනිදා දක්වා බලප්‍රදේශයේ සියළු වීථි ලාම්පු අක්‍රිය කර තබන ලෙසත් විදුලිය ඉතිරි කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල හැකි විකල්ප වේ නම් ඒවා ක්‍රියාවට නංවා ඒ පිළිබඳව දන්වන ලෙසත් සිහිපත් කරමින් මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

සියළු වීථි ලාම්පු අක්‍රිය කර තැබිය නොහැකියි. බස් නැවතුම්පලවල් වැනි ස්ථාන වල රාත්‍රියේ විථි පහන් දැල්වීම අත්‍යාවශ්‍ය වනවා. එමෙන්ම වීථි පහන් අත්‍යාවශ්‍යම නැති ස්ථානත් තිබෙනවා. යම් කිසි ක්‍රමවේදයක් පිළිබඳව ඔබතුමන්ලාගේ අදහස් තිබෙනවා නම් යෝජනා කරන්න. කාර්ය මණ්ඩලය දැනටමත් කාර්යාලය තුල විදුලිය පිරිමැසීමට කටයුතු කරනවා. ඔවුන්ගේ යෝජනාව වූයේ විදුලිය පිරිමැසීමට සහයෝගය දෙන ලෙස බල ප්‍රදේශය පුරා ප්‍රචාරය කිරීම කල හැකි බවයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කොරෝනා ප්‍රශ්නය හේතු කොට ගෙන රටට දුෂ්කර කාලයක් උදා වී තිබෙනවා. මේ අවස්ථාවේදී රජය විසින් සිදු කර තිබෙන්නේ සාධාරණ ඉල්ලීමකුයි. අපි සභාවක් ලෙස හැකි ආකාරයට මේ සඳහා සහයෝගයක් ලබා දිය හැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද මුළු ලෝකයේම විශාල අර්බුදයකට මුහුණ පා තිබෙනවා. විදුලිය පිරිමසා ගැනීමට රජය විසින් අපෙනුත් පොඩි සහයෝගයක් ඉල්ලා තිබෙනවා. වීථි පහන්වල

විදුලිය අපතේ යන අවස්ථා බොහොමයක් තිබෙනවා. මාර්තු 31 වන දින දක්වා කාලය තුල බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරීම නවතමු යැයි මම යෝජනා කරනවා.එමෙන්ම අපි ප්‍රචාරයක් යවා අනවශ්‍ය වීථි පහන් නිවා දැමීමට උපදෙස් දෙමු. අපි ආයතන පවා දැනුවත් කල යුතුයි. අලව්ව නගරයේ සූර්යාලෝකයෙන් ක්‍රියා කරන වීථි පහන් සවිකිරීමට අපි ගිය කමිටුවේදී යෝජනා කලා. නිවසේ විදුලි බල්බ දැල්වීමේ කාලය වැඩි කිරීමට අවශ්‍ය විදුලිය පිරිමසින ක්‍රමවේද අපි යෝජනා කල යුතුයි. ඒ පිළිබඳව ජනතාව දැනුවත් කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ රටේ විදුලි අර්බුදයට මූලික හේතුවක් වී තිබෙන්නේ වර්ෂාව නොමැති වීමයි. එමෙන්ම කොරෝනා ප්‍රශ්නය සහ ආර්ථික දුෂ්කරතාවය දැඩි ලෙස බලපා තිබෙනවා. එම නිසා අපිට විදුලිය නිපදවා ගැනීමට ගැටළු මතුවී තිබෙනවා. මේ අවස්ථාවේදී විදුලිය අරපිරිමැස්මෙන් පාවිච්චි කර අපි ආදර්ශයක් දෙමු යැයි යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, විදුලි අර්බුදය නිසා රජය විශාල අපහසුතාවයකට පත් වී සිටිනවා. ජලාශ සිඳී යාම හේතු කොටගෙන තෙල් බලාගාර වලින් විදුලිය නිපදවීමට සිදු වී තිබෙනවා. ඩොලර් ප්‍රශ්නය නිසා රට තුල ඇතිවී තිබෙන තත්වය තව මාස කීපයකින් පහව යාවි. මුළු ලෝකයම කොවිඩ් වසංගතය නිසා අර්බුදයට ලක් වී තිබෙනවා. මෙම තත්වයට මුහුණ දීමට අපි අරපිරිමැස්මෙන් කටයුතු කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස අපි යම් රැස්වීමකදී කතා කරනවා නම් කතා කරනු ලබන්නේ රටේ පවතින අර්බුදය තේරුම් අරගෙනයි. අපි තව කෙනෙකුට උසුළු විසුළු කර කතා කිරීමේ ප්‍රතිවිපාකය අපේ පස්සෙන් එනවා. අද රටේ තෙල් නැහැ. එවැනි බරපතල අර්බුද ගණනාවකට රටක් ලෙස මුහුණ දී තිබෙනවා. සෑම රටකටම වගේ කොරෝනා වසංගතය පැමිණියා. නමුත් එම රටවල් ආර්ථිකය වට්ටගන්නේ නැතිව නිසි කළමණාකාරීත්වයෙන් කටයුතු කලා. ඒ ආකාරයට අපිත් දූරදර්ශීව කටයුතු කල යුතුයි. එමෙන්ම අපි එකතු වී වැඩකරන විට වචන පාවිච්චි කිරීමේදී ප්‍රවේසම් විය යුතුයි. මෙම ලිපියේ සඳහන් කරන ආකාරයට අමුතුවෙන් විදුලිය පිරිමැසිය යුතු නැහැ. මොකද දැන් දිනකට පැය 7.30 ක් විදුලිය විසන්ධි කරනවා. ඒ අනුව රටේ ජනතාව උපරිම සහයෝගය ලබා දී තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, බල ප්‍රදේශයේ වීථි පහන් අමුතුවෙන් නිවා දැමිය යුතු වන්නේ නැහැ. රාත්‍රියට පැය පහක් පමණ විදුලිය විසන්ධි කරනවා. කොවිඩ් ප්‍රශ්නය නිසා මෙම සියළු අර්බුද නිර්මාණය වූ බව ආණ්ඩු පක්ෂය විසින් පවසනවා. නමුත් ආණ්ඩුවේ කිසිම මූල්‍ය කලමණාකරණයක් පෙනෙන්නට නැහැ. ආණ්ඩුවට කිසිදු දැක්මක් නැහැ. කොවිඩ් නිසා වෙනත් රටවල මෙවැනි අර්බුදයක් ඇතිවෙලා නැහැ. ලංකාවේ සුභසාධනය මේ වන විට විශාල ලෙස කප්පාදු කර තිබෙනවා. රටේ මානව සම්පත පිළිබඳව සිතිය යුතුයි. මෙම තත්වය වලක්වා ගැනීමට නම් අද කාන්තා දිනයේ කාන්තාවන් මුළුතැන්ගෙට සීමා නොවී ශක්තිමත්ව නැගීසිටිය යුතු බව මගේ අදහසයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, අද රටේ උද්ගත වී තිබෙන තත්වය පවතින රජයටම බැර කිරීම අසාධාරණයි. මෙතෙක් රට පාලනය කල සියළුම රජයන් එහි වගකීම දැරිය යුතුයි. සංවර්ධිත රටක් ලෙස ලංකාවේ ආර්ථිකය දියුණු තත්වයක තිබුණේ නැහැ. කොවිඩ් අර්බුදය සෘජුවම පාලන තන්ත්‍රයට බලපෑවා. අපි සෑම ප්‍රශ්නයක් දෙසම සුබවාදීව බලමු. විදුලිය පිළිබඳව

කතාකරන විට අනවශ්‍ය තැන්වල වීථි පහන් දැල්වී තිබෙනු දැකිය හැකියි. සභාව මගින් යම් දැනුවත් කිරීමක් සිදුකර වීථි පහන් නොදල්වන ලෙස උපදෙස් දෙනවා නම් මේ අවස්ථාවේ එය රටට යම් සහනයක් වේවි. වර්ෂාවත් සමඟ මෙම විදුලි ප්‍රශ්නය ඉක්මනින්ම විසඳේවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,1977 න් පසුව අපේ රට ගමන් කල දිශානතිය වෙනස් වුනා. එහි අග්‍ර ප්‍රතිඵලය අපි අද භුක්ති විඳිනවා. සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනිය දේශීය දෙයට මුල්තැන ලබා දුන්නා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේත් උග්‍ර ආර්ථික ප්‍රශ්නයක් තිබුණත් අපේ රට වැටුනේ නැහැ. නමුත් 2019 යහපාලන ආණ්ඩුව පැමිණියායින් පසුව සීඝ්‍ර ලෙස ආර්ථිකය පහල බැස්සා. ඉන් පසුව අපේ රජය පත් වීමත් සමඟ කොවිඩ් වසංගතයට මුහුණ දීමට සිදු වුනා. ඉදිරි කාලයේදී අපි සැමටම අත්වැල් බැඳගෙන ඉදිරියට යාමට හැකි වේවි යැයි මම සිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඇතැම් ස්ථාන වල පැය 24 ම වීථි පහන් දැල්වෙනු අපි දැක තිබෙනවා. අපි සභාවක් ලෙස ප්‍රචාරක රථයක් උපයෝගී කරගෙන නිසි ලෙස නඩත්තු නොකරන වීථි ලාම්පු දැනුම් දීමකින් තොරව ගලවන බවට දැනුවත් කොට ප්‍රචාරයක් ගියහොත් වඩාත් හොඳයි. යම් කිසි ප්‍රගතියක් ඒ තුලින් ලබා ගත හැකියි.

අද රටේ තිබෙන අර්බුද දෙස බලන විට එයට ප්‍රධානම හේතුව වී තිබෙන්නේ කලමණාකරණ දුර්වලතාවයයි. යහපාලන ආණ්ඩුව සමයේ තිබුණු ආර්ථික තත්වය සහ අද තත්වය බලන විට අහසට පොළව වගේ. කෙසේ වෙතත් රටේ අර්බුද ඇතිවන සැම අවස්ථාවකම ඉන් මිදීම සඳහා සහයෝගය ලබාදීම පුරවැසියන්ගේ යුතුකමයි. නමුත් අද ආණ්ඩුව තුලම ඇතිවන තත්ව හේතුකොටගෙන අර්බුද උත්සන්න වී තිබෙනවා. මෙම තත්වයෙන් ගොඩ ඒමට නම් පටු දේශපාලන මත වලින් බැහැර වී එක ප්‍රතිපත්තියක සහ එක වැඩපිළිවෙලක සිට එක ගමනක් දීර්ඝ කාලයක් යාමට හැකි ජාතික වැඩපිළිවෙලක් සකස් කරනවා නම් ඉතාම සාර්ථකව රට ඉදිරියට ගෙන යාමට හැකියාව තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, වීථි පහන් නොනිවා දවස පුරා දැල්වෙන තැන් අපි දැක තිබෙනවා. අපිට කල හැකි පුංචි දේ වත් නොකිරීම මෙම ගොඩක් ගැටළු වලට මූලික හේතුව වී තිබෙනවා. ජයතිලක මන්ත්‍රීතුමා පැවසුවා මෙන්ම මෙම වීථි ලාම්පු සම්බන්ධයෙන් අපි දැඩි දැනුවත් කිරීමක් කලහොත් කවුරුන් හෝ මෙම වීථි පහන් නිවා දැමීමට ඉදිරිපත් වේවි. මෙම විදුලි අර්බුදය නිමා වී ඉක්මනින්ම රටට සහනයක් ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, කොතැනක හෝ දවල් කාලයේදී වීථි ලාම්පුවක් දැල්වී තිබෙනවානම් එය නිවා දැමීමට අපි නම් පෙළඹී තිබෙනවා. පොදු දේපල නාස්ති නොකල යුතු බව සැම කෙනෙකුගේම සිත්වල ධාරණය විය යුතුයි. මෙම සියළු අර්බුද දුරු වී රටට වාසනාවන්ත කාලයක් උදා වේවා යි ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

බැසිල් රාජපක්ෂ මැතිතුමන් ඉදිරිපත් කර තිබෙන්නේ බලප්‍රදේශයේ වීථි පහන් මාර්තු 31 දින දක්වා නොදල්වා තබමු යන යෝජනාවයි. එමෙන්ම ආයතන වල විදුලිය පාවිච්චි කිරීමත් පිරිමසන ලෙස ආයතන දැනුවත් කර තිබෙනවා. වීථි පහන් අළුත්වැඩියා කිරීම අපි ටික කාලයකට නවත්වමු යැයි මම ඉල්ලා සිටිනවා. කොරෝනා උවදුර නිසා අපි විවිධ පීඩා වින්දා. නමුත් අපේ රටේ නායකයින් රටේ ජනතාවගේ ජීවිත බේරා ගත්තා. තිස් අවුරුදු යුද්ධය නතර කර තරුණ ජීවිත බේරා දුන්නා වගේම කොරෝනා උවදුරේදී හැකි ඉක්මනින් එන්නත් ලබා දී අපේ ජීවිත බේරා දුන්නා. ඒ සඳහා විශාල වියදමක් ද දරනු ලැබුවා. අපේ රට පමණක් නොව මේ වන විට අනෙක් රටවලුත් විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දී තිබෙනවා.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.1 උප දුම්රිය ස්ථානයක් ඉදි කිරීම.

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වඩුවාව අංක 05 කොට්ඨාශයට සම්බන්ධ කොළඹ - කුරුණෑගල මාර්ගයේ යාංගල්මෝදර යන ස්ථානයේ (දඹදෙණිය පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශයේ) උප දුම්රිය ස්ථානයක් ඉදි කිරීමට සුදුසු බවට යෝජනා කරමින් අලව්ව ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපති එච්.එම්. ධර්මරත්න හේරත් මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මම නාරම්මල ප්‍රාදේශීය සභාවේ සිටින කාලයේත් මෙම යෝජනාව ඉදිරිපත් කලා. නමුත් ආණ්ඩු වෙනස් වීමත් සමඟ එය ඉටු වූයේ නෑ. පසුව ඩලස් අලහප්පෙරුම අමාත්‍යතුමාටත් ලිපියක් යොමු කලා. මේ අවස්ථාවේදී එම යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට තීරණය කලා. මා බලාපොරොත්තු වන්නේ ප්‍රාදේශීය සභාව හරහා ප්‍රවාහන අමාත්‍යතුමාට, ගරු අගමැතිතුමාට සහ ගරු ජනාධිපතිතුමාට අදාල ලිපි ඉදිරිපත් කර අවශ්‍ය කටයුතුසිදු කර ගැනීමයි. යාංගල්මෝදර මංසන්ධිය දැනට මේ ප්‍රදේශයේ තිබෙන ඉතාම වැදගත් ස්ථානයක් බවට පත් වී තිබෙනවා. එය අධිවේගී මාර්ගයට යාමට ඇති පහසුම ස්ථානයක් වගේම මහමෙව්නා භාවනා අසපුව සඳහා එන බැතිමතුන්ගේ පහසුව සඳහාත් එය ඉතා වැදගත් වෙනවා. වලකුඹුරෙහි දුම්රිය ස්ථානයක් තිබියදී තවත් උප දුම්රිය ස්ථානයක් සෑදිය හැකි දැයි ප්‍රශ්නයක් මතුවිය හැකියි. නමුත් ඇතැම් ස්ථාන වල උප දුම්රිය ස්ථාන සාදා තිබෙන දුර ප්‍රමාණ දෙස බැලීමේදී එය ගැටළුවක් වන්නේ නැහැ. එමෙන්ම ජනතාවට පහසුකම් තිබෙන වඩාත් යෝග්‍ය ස්ථානය වන්නේ යාංගල්මෝදර හන්දියයි. එම නිසා අපි අදාල ස්ථාන වලට මෙම ඉල්ලීම යොමු කර එම කටයුත්ත ඉටුකර ගැනීම සඳහා උපරිම උත්සාහයක් යොදමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක්. අපි ප්‍රායෝගික පැත්ත දෙස බලද්දී වලකුඹුර දුම්රිය ස්ථානයෙන් කොළඹට රැකියා සඳහා යාමට සිය ගණනක් පැමිණෙනවා. බොහෝ දෙනෙක්ට වලකුඹුර දුම්රිය ස්ථානයට පයින් ගමන් කිරීමට සිදු වී තිබෙනවා. ප්‍රධාන මාර්ගයේ බස් රථ වලින් පැමිණන පිරිස් වලට පවා මෙම ස්ථානයේ දුම්රිය ස්ථානයක් ස්ථාපිත කලහොත් එයින් විශාල සෙතක් සැලසෙනවා. මෙම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා වගේම දුරබැහැර ජනතාවගේ අවශ්‍යතා පිරිමැසීමට මෙය රුකුලක් වෙනවා. මෙම යෝජනාව කුරුණෑගල ස්ථාපිත කර ඇති ගරු අග්‍රාමාත්‍යතුමාගේ කාර්යාලය හරහා ඉටු කරගැනීමේ හැකියාව තිබෙනවා. මේ සඳහා මගේ උපරිම සහයෝගය උප සභාපතිතුමන්ට ලබා දෙනවා. එමෙන්ම ඒ සඳහා පක්ෂ විපක්ෂ සියළු දෙනාගේම සහයෝගය ලැබේවි. ඒ අනුව හැකි ඉක්මනින් යාංගල්මෝදරට උප දුම්රිය ස්ථානයක් ගෙන ඒමට කටයුතු කරමු යැයි ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය ඉතාමත් වැදගත් යෝජනාවක්. යාංගල්මෝදර සිට මොරවලපිටිය දක්වා ගම් 25 ක් පමණ තිබෙනවා. මේ අතර අධිවේගී මාර්ගයේ පිවිසුම් දොරටුවත් තිබෙනවා. එමෙන්ම මහමෙව්නා අසපුවත් තිබෙනවා. එම නිසා යාංගල්මෝදර උප දුම්රිය ස්ථානයක් ඉදි කිරීම බොහොමත්ම ප්‍රයෝජනවත් වෙනවා. එය ජනතාවට විශාල පහසුවක් වේවි. අපි සියළු දෙනාගේම ශක්තිය මේ සඳහා යොදවමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය ඉතාමත් හොඳ යෝජනාවක් ලෙස මමත් දකිනවා. යාංගල්මෝදර හන්දිය විශාල දුම්රිය අනතුරක් සිදු වූ ස්ථානයක්. ඇතැම් විට එම දුම්රිය අනතුරු වලක්වා ගැනීමටත් මෙම ස්ථානයේ උප දුම්රිය ස්ථානයක් ඉදි කිරීමෙන් හැකියාව ලැබෙනවා. එම නිසා ඔබතුමියගේ පැත්තෙන් ඊට සුදුසු කටයුතු කඩිනමින් ඉටු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, යාංගල්මෝදර සිට මොරවලපිටිය දක්වා සියළුම ගම්වාසීන් වෙනුවෙන් සහ අවට තිබෙන ගම්වල ජනතාවට සෙත සැලසෙන ඉතාමක් හොඳ යෝජනාවක් උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. මෙම ප්‍රදේශවල දුර බැහැර රැකියාවලට යන බොහෝ දෙනෙකුට යාංගල්මෝදර සිට වලකුඹුර දුම්රිය ස්ථානයට පයින් යාමට සිදු වී තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමා මෙම දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයායි. එම නිසා මහා සභාවේ ඒකඡන්දයෙන් සම්මත වුනු යෝජනාවක් ලෙස එතුමාට යොමු කල විට එය ඉටු කර ගැනීමේ හැකියාව ලැබේවි. මීට ඉහතදී බල ප්‍රදේශයේ දුම්රිය රක්ෂිතයට අයත් සියළු ඉඩම් බදු කොන්දේසිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාවට ලබා දෙන ලෙස ජයතිලක මන්ත්‍රීතුමා  විසින් යෝජනාව ගෙන ආවා.නමුත් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඊට කිසිදු ප්‍රතිචාරයක් ලැබුණේ නෑ. එම කාරණාවත් සිහිපත් කරමින් ගරු විෂය භාර අමාත්‍යතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත් යාංගල්මෝදර උපදුම්රිය ස්ථානයක් ඉදිකිරීම සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, යාංගල්මෝදර හන්දියේ උප දුම්රිය ස්ථානයක් ඉදි කිරීම සම්බන්ධයෙන් උප සභාපතිතුමාගේ විශාල උනන්දුවක් සහ බලාපොරොත්තුවක් තිබෙනවා. යාංගල්මෝදර හන්දිය මේ වන විට පහසුකම් අඩු තත්වයකට පත් වී තිබෙනවා. මෙවැනි දුම්රිය ස්ථානයක් ඉදි වීමෙන් එම ස්ථානය යම්තාක් දුරට හෝ දියුණුවට පත් කල හැකියි. මහමෙව්නා අසපුවට පැමිණෙන සැදැහැවතුන් ගමනාගමනය සම්බන්ධයෙන් බොහෝ අපහසුතා වලට පත් වෙනවා. මෙම ඉල්ලීම ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට යොමු කර ජනතාවට විශාල සේවයක් සිදුවන එම උප දුම්රිය ස්ථානය ඉදි කිරීමටත් යාංගල්මෝදර ප්‍රදේශය දියුණු කිරීමටත් කටයුතු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගරු උප සභාපතිතුමා ගෙන ආ යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක්. මේ ප්‍රදේශයේ තිබෙන මහමෙව්නා භාවනා අසපුව මූලික කරගෙන ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකින්ම දිනපතා සැදැහැවතුන් පැමිණෙනවා. එමෙන්ම ඓතිහාසික රැනගල රජමහා විහාරයටත් බැතිමතුන් විශාල ප්‍රමාණයක් පැමිණෙනවා. මීට අමතරව ප්‍රධාන පාසල් තිබෙනවා. එමෙන්ම අධිවේගී මාර්ගයේ නාකලගමුව පිවිසුම ද පිහිටා තිබෙනවා. එම නිසා ප්‍රවාහන පහසුකම අවශ්‍යම ස්ථානයක් ලෙස යාංගල්මෝදර හන්දිය හැඳින්විය හැකියි. ඒ අනුව යාංගල්මෝදර උප දුම්රිය ස්ථානයක් සකස් කිරීම සඳහා ඔබතුමියගේ මූලිකත්වයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය හරහා අතිගරු ජනාධිපතිතුමාට සහ ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කර ඒ සඳහා මූලිකත්වය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගරු උපසභාපතිතුමන් දුම්රිය දෙපාර්තමේන්තුවේ රාජකාරී කල නිලධාරියෙක් ලෙස ඒ කාලයේ සිටම යාංගල්මෝදර උප දුම්රිය ස්ථානයක් ඉදි කිරීම සම්බන්ධයෙන් ලොකු උත්සාහයක් ගනු ලැබුවා. ගමන් පහසුව නොමැති වීම නිසා මෙම ප්‍රදේශයේ දුර බැහැර රාජකාරී සඳහා පිටත්ව යන අය විශාල අපහසුතාවයකට ලක් වෙනවා. යාංගල්මෝදර දුම්රිය ස්ථානයක් සෑදීමට හැකි වුවහොත් මෙම අපහසුතාවය බොහෝ දුරට නැති වී යනවා. එම නිසා එතුමා ගෙන ආ එම යෝජනාවට එම ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ලෙස මගේ උපරිම සහයෝගය, ශක්තිය ලබා දෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
ගරු උප සභාපතිතුමා ඉතා වැදගත් මෙන්ම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීමට කටයුතු කරනවා. එක්දාස් නවසිය හැට ගණන්වල මැද භාගයේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කල මගේ පියා යාංගල්මෝදරට දුම්රිය ස්ථානයක් ඉල්ලූ විට එදා යාංගල්මෝදර පැවති නොදියුණු තත්වය මෙන්ම වංගුවත් මහා මාර්ගයත් නිසා මෙම දුම්රියපොල වලකුඹුර ප්‍රදේශයට ගැලපෙන බවට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් තීරණය කර තිබුණා. එම වකවානුවේ හැටියට ඒ තුලින් විශාල ප්‍රයෝජනයක් ජනතාව ලබා ගත්තා. ඉහළ වලකුඹුර දුම්රිය පාර හරහා යන තැන විශාල අනතුරු සංඛ්‍යාවක් ඇති වුනා. එම ස්ථානයට විදුලි සංඥා ලබා දීමට මට හැකියාව ලැබුනා. අද ඉදිරිපත් වූ මෙම යෝජනාව අප අදාල අංශ වලට ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වඩුවාව අංක 05 කොට්ඨාශයට සම්බන්ධ කොළඹ - කුරුණෑගල මාර්ගයේ යාංගල්මෝදර යන ස්ථානයේ (දඹදෙණිය පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශයේ) උප දුම්රිය ස්ථානයක් ඉදි කිරීම සම්බන්ධයෙන් ගරු උපසභාපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් අදාළ බලධාරීන්ට යොමුකිරීමට තීරණය විය.

**<u>03.2 අලව්ව ගනේකන්ද මාර්ගයේ වැසි කාණු පුද්ගලික ඉඩම් වලට යොමු කර තිබීමෙන් සිදුවන හානිය.</u>**
අලව්ව ගනේකන්ද මාර්ගයෙහි වැසි ජල අපවහන කාණු පද්ධතියක් නොපැවති අතර වැසි ජලය ස්වභාවිකව පිහිටි ජල මාර්ග ඔස්සේ අපවහනය සිදු වූ අතර ජලාශය ඉදි කිරීම සඳහා ස්වභාවික අපවහන පද්ධතිය වෙනස් කිරීමක් සිදු නොවිනි. කෙසේ වුවද ජලාශ ඉදි කිරීම හා ජල නල එළීම හේතුවෙන් එම මාර්ගයට සිදු වී ඇති හානි ප්‍රතිසංස්කරණය කොට තිබූ තත්වයට පත්කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දී ඇති බව දන්වමින් පොල්ගහවෙල පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂතුමා විසින් යොමු කර ඇති ලිපිය.

එමෙන්ම පොල්ගහවෙල පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියෙහි පානීය ජල නල එලීමේදී අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් අලව්ව ක්‍රීඩාංගන මාවත ජලනල එලීමෙන් පසු යථාවත් කිරීම සම්බන්ධව දැනුවත් කර ඇති බවත් එය කඩිනමින් යථාවත් කිරීමට කොන්ත්‍රාත්කාර සමාගම වන වාටෙක් වාබග් ආයතයට දැනුම් දුන් බව දන්වන බවත් පිළිසකර කටයුතු කිරීම ප්‍රමාද වීමක් හෝ තවදුරටත් යම් අඩුපාඩුවක් ඇතොත් අවශ්‍ය කටයුතු සඳහා දැනුවත් කරන ලෙසත් දන්වමින් පොල්ගහවෙල පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම ජල ව්‍යාපෘතිය සඳහා ගනේකන්ද ස්ථානය තෝරාගැනීමෙන් පසුව අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සමඟ සෘජු සම්බන්ධතාවයක් උඩ අදාල කොන්ත්‍රාත්කරුවන් එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කල යුතු බවට විශේෂ අවබෝධතාවක් ඇතිකරගනු ලැබුවා. ඔවුන් ජල නල එලා අවසන් කරන විට නිවැරදි ආකාරයට නැවත මාර්ගය සකස්කර දීමට පොරොන්දු වුනා. නමුත් පසුගිය කාලය තුල මෙම ඉන්දියන් සමාගම කටයුතු කල ආකාරය දෙස බලන විට ඔවුන් පිළිබඳ විශ්වාසයක් තැබිය යුතු බව තහවුරු වෙනවා. එම නිසා මෙය සභාවේ මාර්ගයක් බැවින් විශේෂ අවධානය යොමු කර ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන් සහ කොන්ත්‍රාත්තුව සිදු කරන සමාගමේ නිලධාරීන් කැඳවා ඔවුන් සමඟ සාකච්ඡා කර නිවැරදි වැඩපිළිවෙලකට යන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,ජල ව්‍යාපෘතියේ වැඩිම ජල නල පද්ධති ප්‍රමාණයක් යන්නේ මගේ කොට්ඨාශය හරහායි. ජල සම්පත් මණ්ඩලය අපි සමඟ ඉතාම සුහදව කටයුතු කරනවා. නමුත්

මෙම ඉන්දියන් සමාගම අවස්ථාවාදීව කටයුතු කරන ආයතනයක් බවට පත් වී තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ කොට්ඨාශවල මෙම ජල නළ එලීම නිසා ආපදා වූ ස්ථාන පිළිබඳ තොරතුරු සභාපතිතුමියට යොමු කර එම විනාශ වුනු මාර්ග සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය කරන ද්‍රව්‍ය හෝ අදාල සමාගම වෙතින් ලබා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කරගත යුතුයි. එම නිසා ඔබතුමිය ජල සම්පත් මණ්ඩලයත් ඉන්දියන් සමාගමේ නියෝජිතයිනුත් ගෙන්වා මෙම ව්‍යාපෘතිය අවසන් වීමට මත්තෙන් ආපදාවට ලක් වූ මාර්ග සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මගේ කොට්ඨාශයේ ජල නළ පද්ධතිය එලන විට අග්බෝව උඩගන්කන්ද කොන්ක්‍රීට් මාර්ගය විනාශයට පත් වුනා. මේ පිළිබඳව දැනුම් දීමක් කල ද එයින් පලක් වූයේ නැහැ. එමෙන්ම වැසි දිනවල ගනේකන්ද වතුර ටැංකිය අසලින් එන වතුර පාර සම්පූර්ණයෙන්ම පහළට හරවා තිබෙනවා. එම නිසා විශාල ජලස්කන්ධයක් පහළ තිබෙන නිවෙස් වලට එනවා. ඒ පිලිබඳව නිසි විසඳුමක් ලබා දී අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජල නල එලීමේදී බල ප්‍රදේශයේ මාර්ග ගණනාවක් දැඩි ලෙස විනාශයට පත් වී තිබෙනවා. ගල්ගමුව මාර්ගයේ කන්දේගෙදර පන්සල අසල මාස 8 ක් තිස්සේ ඉතා ගැඹුරු කාණුවක් කපා තිබුනා. එසේ සෑම මාර්ගයකටම විශාල ලෙස හානි සිදු වී තිබෙනවා. දම්මැහැර මාර්ගයත් විශාල ලෙස විනාශ වුනු මාර්ගයක්. මෙම මාර්ග යථා තත්වයට පත් කිරීමට අති විශාල මුදලක් වැය වෙනවා. මොවුන් ගෙන්වා මේ පිළිබඳව දැනුවත් කර විනාශයට පත් වූ මාර්ග යථා තත්වයට පත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ගිරිඋල්ල මාර්ගයේ ජල නල එලීම සම්බන්ධයෙන් ගත්විට කිසිදු වගකීමක් හෝ ප්‍රමිතියක් දක්නට ලැබෙන්නේ නෑ. ජල නල එලීම සඳහා කපන ලද වලවල් වලට වැටී අනතුරු පවා සිදුවෙනවා. මෙම අලව්ව ගිරිඋල්ල මාර්ගය කාපට් කරන විට මාර්ගයේ දෙපැත්ත ඉතාම ශක්තිමත් ලෙස සකස් කරනු ලැබුවා. නමුත් මොවුන් ජලනල එලීමෙන් අනතුරුව නිකන් පස් දමා සකසනවා මිස ප්‍රමිතියකට සකස් කරන්නේ නැහැ. ඉඹුල්ගොඩ මාර්ගයේත් සෑම තැනකම වලවල් හාරා මාර්ගය විනාශ කර තිබෙනවා. මේවාට බැනුම් අහන්නේ දේශපාලඥයන් ලෙස අපියි. කුමන රජයක් යටතේ වුවත් මෙසේ විනාශ වන්නේ මහජනතාවගේ මුදලුයි. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉහළට දැනුම් දී දෙපස තිබෙන කාණු පද්ධතියට හානියක් නොවන ලෙස ක්‍රමවත්ව සහ විධිමත්ව අදාල නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ජලනල එලීමේ කටයුතු සිදුකරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනිඑච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි,ගනේකන්ද වතුර ටැංකිය අසල මාර්ගයේ ප්‍රශ්නය දීර්ඝ කාලයක සිට තිබෙන ගැටළුවක්. මීට කලිනුත් ප්‍රදේශවාසීන් සහ අදාල නිලධාරීන් සම්බන්ධ වී මෙම සභාවේදී සාකච්ඡාවක් කලා. එහිදී මාර්ගය තිබූ ආකාරයටම කොන්ක්‍රීට් කර දෙන බවට ඔවුන් පොරොන්දු වුනා. එම මාර්ගයේ ඉවුර කඩාගෙන ගොස් තිබෙන ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට ලක්ෂ 5 ක පමණ මුදලක් සභාවෙන් වෙන් කිරීමටත් පොරොන්දු වුනා. මෙහිදී ජල සම්පත් මණ්ඩලය සහ කොන්ත්‍රාත්කරුවන් යන දෙපිරිස දෙපැත්තට අදින තත්වයක් තිබෙනවා. එම නිසා අදාල නිලධාරීන් සහ අදාල සමාගම එක තැනකට කැඳවා මෙය සාකච්ඡා මට්ටමට ගෙන ආවොත් හොඳයි. නාරම්මල මාර්ගයේ සිට ගොරොක්ගස්දෙණිය සිට පරණවත්ත දක්වා දිවෙන මාර්ගයේ මගේ නිවස ඉදිරිපිට සිට කණින ලද ලොකු කානුව නිසා මාර්ගයේ ගිලා බැස්මක් ඇති වී තිබෙනවා. මේ වන විට එය පිළිසකර කිරීම ආරම්භ කර තිබුනත් එය සිදු වන්නේ කිසිදු පළපුරුද්දක් නොමැති කම්කරුවන් විසිනුයි. එම නිසා අපි මේ සඳහා හැකි ඉක්මනින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු බව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙම ජල යෝජනා ක්‍රමයෙන් අලව්ව බල ප්‍රදේශයේ මාර්ග වලට දැඩි ලෙස හානි සිදුවී තිබෙනවා. ජල නල එලනු ලබන කොන්ත්‍රාත්කරුවන් එය සිදුකරනු ලබන්නේ කිසිදු දැනුමක් නොමැතිවයි. මෙම කටයුතු නිසා බඹරගල මංසන්ධියේ අඟල් 6 ක් පමණ පහතට බසින ලද ස්ථානයක් තිබෙනවා. මෙවැනි ස්ථාන නිසා අනතුරු බහුල වී තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරිය හෝ ජල සම්පාදන මණ්ඩලය විසින් මෙම විනාශයන් සම්බන්ධව වගකීමක් ගනු ලබන්නේ නැහැ. ඔබතුමිය මූලිකත්වය ගෙන අදාල සමාගම කැඳවා දැඩි ලෙස අවවාද කල යුතු බව මගේ අදහසයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එදා සිට අද දක්වා ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධනය කල මාර්ග වලට මෙම ජල නල එලීම තුලින් විශාල ලෙස හානි සිදුවී තිබෙනවා. මලඇලේ කන්ද උඩ කොස්කන්දේ සිට එන විශාල ජල පහර ගලාගෙන යාමට පලපු ගල් යොදා ඉතා ශක්තිමත් ලෙස සකස් කර තිබුනා. නමුත් මෙම ජල ව්‍යාපෘතිය නිසා එම ගල් ගලවා තිබෙනවා. දැන් එම ස්ථානය විශාල අනතුරුදායක ස්ථානයක් බවට පත් වී තිබෙනවා. මේ සියල්ලටම හේතු වී තිබෙන්නේ අපේ රටේ තිබෙන පරිපාලන ව්‍යුහයේ දුර්වලතාවයයි. මෙලෙස යම් සමාගමකට පළාත් පාලන ආයතනය හෝ ජල සම්පාදන මණ්ඩලය අභිබවා කටයුතු කල හැකිද යන්න ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ සිදුවන දූෂණ, වංචා සියල්ලකටම රාජ්‍ය නිලධාරීන් වගකිව යුතුයි. අපි අදාල සමාගමේ නිලධාරීන් ගෙන්වා මෙම ජල ව්‍යාපෘතියට අදාල යෝජනාව නිසි ආකාරයෙන් පරික්ෂා කල යුතුයි. අදාල සමාගමත්, ජල සම්පත් මණ්ඩලයත් මන්ත්‍රීවරුනුත් කැඳවා සාකච්ඡා කර කඩිනමින් විසඳුමකට පැමිණිය යුතුයි. මොකද මෙලෙස විනාශ වෙමින් යන්නේ මහජන නියෝජිතයින් ඉතාම දුක් ගැහැට මැද සංවර්ධනය කල මෙම බල ප්‍රදේශයේ මාර්ග පද්ධතියයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම සභාපති ධූරයේ වැඩ බලන සමයේ අලව්ව ගනේකන්ද ප්‍රදේශයේ ජනතාව මෙම ප්‍රශ්නයට ඉතා ඉක්මනින් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. ඒ අනුව එම ප්‍රදේශයේ ජනතාවත් ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීනුත් අදාල කොන්ත්‍රාත් සමාගමේ නිලධාරීනුත් මෙම ස්ථානයට ගෙන්වා සාකච්ඡා කර සුභවාදී තත්වකට ගෙන ආවා. අලව්ව බල ප්‍රදේශයට ජලය ලබා දීමට නියමිතව තිබෙන්නේ අලව්ව ගනේකන්ද ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන ටැංකි වලිනුයි. මෙහිදී වර්ෂාවෙන් ඉහළ සිට එන ජල පහර රතනාලංකාර විද්‍යාලයට එන තත්වයක් තිබුනා. කෙසේ වෙතත් මෙම ගැටළු යම්තාක් දුරට හෝ විසඳීමට මට හැකියාව ලැබුනා. මෙම මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කලා සේම මෙම ගැටළුවේදී කල යුත්තේ අදාල නිලධාරීනුත්, සමාගමත්, ජනතාවත් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුත් කැඳවා සාකච්ඡා කර අදාල සමාගමට දැඩි බලපෑමක් කිරීමයි. ගමේ තිබෙන ප්‍රශ්න දකින්නේ මහජන නියෝජිතයෝයි. ජනතා නියෝජිතයාත් සමඟ සාකච්ඡා කර මෙම කටයුතු සිදුවෙනවා නම් මෙවැනි ගැටළු ඇති වන්නේ නෑ. එම නිසා ජනතා නියෝජිතයින් මෙම කටයුතු වලට සම්බන්ධ කර ගැනීමේ වැඩපිළිවෙලකුත් මේ තුලින් යෝජනා කර යැවිය යුතුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඔබතුමන්ලා පැවසූ දේ සත්‍යයි. මාර්ග වල ගමන් කරන විට ඒවාට සිදුවී තිබෙන හානිය හොඳින්ම පෙනෙනවා. පසුගිය කාලයේ අපේ සභාව පරිපාලන ව්‍යුහයට කිසිම සම්බන්ධතාවයක් නොමැති ආයතනයක් බවට පත්වෙමින් තිබුනා. දැන් එම තත්වය යම්තාක් දුරට පහවී ගොස් තිබෙනවා. මෙම ඉන්දියන් සමාගම පාලනය කිරීමට සභාවට පැවති අවස්ථාව මේ වන විට නැති වී තිබෙනවා. දැන් මෙය කතා කල යුත්තේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව ආදියේදී යි. මෙම ඉන්දියන් සමාගමෙන් සිදු වූ සියළුම හානි කැටි කොට ප්‍රාදේශීය

සංවර්ධන කමිටුවේ සභාපතිතුමාට ඉදිරිපත් කල යුතුයි. මීට අවුරුදු ගණනාවකට කලින් පොල්ගහවෙල ජල මූලාශ්‍රය තුලින් ජල නල එලීමේදී මාර්ග වලට හානියක් නොවීමට කටයුතු කලා. මෙම ඉන්දියන් සමාගම සිදුකර තිබෙන හානිය පිළිබඳව හෝ අදාල ඇස්තමේන්තුගත මුදල් පිළිබඳව අප වැනි සභාවක් කතාකිරීමෙන් ඵලක් වේ දෝ යි සැකයක් තිබෙනවා. එම නිසා එය මීට වඩා ඉහළට යා යුතු ප්‍රශ්නයක් වෙනවා. කෙසේ වෙතත් මෙම ගැටළුව අපි ජල සම්පත් මණ්ඩලය සමඟ කතාකල විට මින් ඉදිරියට මෙම ජලනල එලීම ඍජුවම සභාවත් සමඟ සම්බන්ධ වී සිදුකිරීමට එකඟතාවය පල කලා. ප්‍රාදේශීය සභා මාර්ග වල නළ එලීමේ කටයුතු වලදී ඇතිවන ගැටළු අදාල කොට්ඨාශයේ මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන ගමේ ජනතාවත් සමඟ සාකච්ඡා කර විසඳුමකට පැමිණිය යුතු බව අපි දැනුවත් කලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රනගල සිට වදාකඩ දක්වා මෙම ජල ව්‍යාපෘතියට මගහැරී තිබෙන කොටස සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමාටත් ජනතාවගේ අත්සන් ලේඛනයක් සමඟ ඉදිරිපත් කලා. එමෙන්ම සුමිත් රාජපක්ෂ මැතිතුමාටත් යොමු කලා. නමුත් ඒ සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිවක් අපිට දැනගන්නට ලැබුනේ නැහැ. මීට අමතරව අප ප්‍රාදේශීය සභාවෙන් යෝජනා කර ගරු අගමැතිතුමාටත් යොමුකලා. ජනතාව නිරන්තරයෙන් ඒ පිළිබඳ විමසනවා. ඒ සම්බන්ධයෙන් කුමක් හෝ දැනුවත් වීමක් තිබෙනවාද යන්න දැනගැනීමට කැමතියි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

සභාවේදී ඔබතුමා ඉදිරිපත් කල යෝජනාව ඉහළට ඉදිරිපත් කර තිබෙනවා. මෙම ජල ව්‍යාපෘතියේ නලවලින් එම ප්‍රදේශවලට ජලය ලබා දිය නොහැකි නම් එම ප්‍රදේශවලට ජල මූලාශ්‍රයක් සොයා ඒ තුලින් ජලය ලබා දීමට කටයුතු කිරීම සඳහා උපදෙස් ලැබෙමින් පවතිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි සම්බන්ධීකරණ කමිටුවට මෙය ඉදිරිපත් කරනවා නම් සම්බන්ධීකරණ කමිටුවට සහභාගී වන්නේ පොල්ගහවෙල අලව්ව ජල සම්පාදන මණ්ඩලයේ ස්ථානාධිපතිතුමා පමණයි. මෙම ව්‍යාපෘතියට කිසි ලෙසකින් එතුමාගේ සම්බන්ධතාවයක් නැහැ. එතුමා සිදු කරන්නේ දෛනික ජලය බෙදා හැරීමේ කටයුතු පමණයි. එම නිසා මෙම ව්‍යාපෘති අධ්‍යක්ෂකතුමාත් , ඉන්දියන් සමාගමේ නිලධාරීනුත් සම්බන්ධීකරණ කමිටුවට ගෙන්විය යුතුයි. අපි දැන්මම ජල සම්පත් මණ්ඩලය මේ සම්බන්ධයෙන් දැනුවත් කල යුතුයි. ප්‍රාදේශීය ලේකම්තුමිය හරහා හෝ අදාල නිලධාරීන් අදාල කමිටුවට කැඳවාගතහොත් මෙම කටයුත්ත සාර්ථක වේවි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඔබතුමන්ලාගේ ඉල්ලීම අනුව ජල සම්පත් මණ්ඩලයත්, අදාල කොන්ත්‍රාත් සමාගමත් ගරු මන්ත්‍රීතුමන්ලා සමඟ සාකච්ඡාවක් මෙහිදී කැඳවීමට කටයුතු කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ජල ව්‍යාපෘති සැලැස්මේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 10 ක් ඇතුලත් වී තිබුනේ නෑ. එම ප්‍රදේශ වලට වෙනම ටැංකියක් මගින් ජලය ලබා දෙන බවයි පැවසුවේ. එහි තත්වය කුමක්ද?

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ගිරිඋල්ල ජල මූලාශ්‍රය පටන්ගත් කාලයේ සිට මා එයට සම්බන්ධ වී සිටි නිසාත් එය පැමිණ තිබෙන දුර දන්නවා. කුඩගම්මනින් බෝයවලාන පැත්තට මෙම නල පද්ධතිය ලබා ගැනීමට ඉල්ලුම් කර තිබෙනවා. මේ වන විට ඒ පිළිබඳව සාකච්ඡා වෙමින් පවතිනවා. මේ කාරණා සියල්ල ගොනු කරගෙන අදාල තොරතුරු සියල්ල ලබාගැනීමෙන් පසුව මන්ත්‍රීතුමන්ලා සමඟ සාකච්ඡාවක් කැඳවා මම දැනුවත් කරන්නම්.

**<u>03.3 ප්‍රාදේශීය සභාවේ අනුග්‍රහය ලබා ගැනීම.</u>**

බුජ්ජොමුව ශ්‍රී බෝධිමළුව විහාරස්ථානයේ ශ්‍රී ගුණරතන ස්වාමීන් වහන්සේගේ උප ප්‍රධාන සංඝනායක උත්සවය මහනුවර අස්ගිරිය විහාරස්ථානයේ අනු නායක ස්වාමීන් වහන්සේ ඇතුළු පළාත්වාසීන්, ප්‍රදේශවාසීන්, මහා සංඝරත්නය හා දළදා මාලිගාවේ දියවඩන නිලමේතුමා ප්‍රමුඛ අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් 2022.03.20 වන දින සිදු කිරීමට නියමිතව ඇත. බුජ්ජොමුව දුම්රිය හරස් මාර්ගයේ සිට ශ්‍රී බෝධිමළුව විහාරස්ථානය දක්වා ඇති මාර්ගය ඉතා අබලන් තත්වයට පත්ව ඇති බැවින් එම මාර්ගය සකස් කර මාර්ගය දෙපස කැලෑ එළි කර පිරිසිදු කර දෙන ලෙසත් මෙම උත්සවය සඳහා පැමිණෙන වාහන නැවැත්වීම සඳහා පෞද්ගලික ඉඩමක් හෝ සකස්කර දෙන ලෙසත් උත්සවයට පැමිණෙන ජනතාව සඳහා බීමට ජල ටැංකි දෙකක් උත්සව භූමිය තුල ස්ථාපනය කර දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් ශ්‍රී බෝධිමළුව විහාරස්ථාන දායක සභාව විසින් යොමුකර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, බුජ්ජොමුව ශ්‍රී බෝධිමළුව විහාරස්ථානයේ ශ්‍රී ගුණරතන හිමිපාණන්ගේ උප ප්‍රධාන සංඝනායක උත්සවය සඳහා ප්‍රාදේශීය සභාව වෙතින් ඉල්ලීම් කර ඇති අනුග්‍රහය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කොහොලාන පන්සලේ ස්වාමීන් වහන්සේගේ අපවත් වීමේදී සභාවක් ලෙස සිදුකල යුතු සියළු කටයුතු ඔබතුමියගේ අනු දැනුම මත සිදු කරනු ලැබුවා. ඒ වෙනුවෙන් අපේ දායක සභාවේත් ප්‍රදේශයේ ජනතාවගේත් ගෞරව පූර්වක ස්තූතිය කොට්ඨාශයේ මන්ත්‍රීතුමා ලෙස මා විසින් පුදකර සිටිනවා.

ඒ අනුව ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට තීරණය විය.

**<u>03.4 කොස් ගස් දෙකක් කැපීම සම්බන්ධවයි.</u>**

ඔත්නාපිටිය, නෙළුන්දෙණිය පදිංචි ජේ.එච්. සමන්ති ජයමහ විසින් එවා ඇති ලිපියට අනුව තමා සතු ඉඩමට යාබදව ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ පදිංචි කම්කරුවෙකු ප්‍රාදේශීය සභාව ලවා කොස් ගස් දෙකක් කපා ඉවත් කර ඇති බවත් එම කොස්ගස් මුළුමනින්ම පාහේ තමාගේ ඉඩමේ පිහිටා තිබූ නිසා ඒවා ඉවත් කිරීමේදී තමා දැනුවත් නොකිරීමෙන් තමා හට අගතියක් සිදුවී ඇති බවත් තමා සතු සින්නක්කර ඉඩම බලයලත් මිනින්දෝරුවෙකු ලවා මැන මායිම් කණු සවිකර ඇති බැවින් මෙම අත්තනෝමතික ක්‍රියාවෙන් පැහැදිලිවම තමා හට අගතියක් සිදු වී ඇති බැවින් එම ක්‍රියාව පරික්ෂා කර තමාට සාධාරණත්වය ඉටු කර දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ඉඩම ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් ලෙස අපේ සභාවේ ඉන්න තැනක් නොමැති කම්කරු මහත්වරුන්ට සහ අලව්ව බස් නැවතුම්පල කොටස සංවර්ධනය කිරීමේදී ඉවත් කල පවුල් කිහිපය මෙම ඉඩමේ පදිංචි කරනු ලැබුවා. එම නිසා මේ සියල්ල සභාව සතු ඉඩම් සහ සභාව සතු ගස්කොලන් වෙනවා. අපි මෙම සභාවේදී එම කොස්ගස් අනතුරුදායක නිසා කපා ඉවත් කිරීමට තීරණය කරනු ලැබුවා. එය සිදු කලේ අපේ සභාවේ කාර්මික නිලධාරී මහත්වරු ගස් පරික්ෂා කිරීමෙන් අනතුරුවයි. එසේ එම තැනැත්තියට මෙම කොස් ගස් අයත් බව පවසනවා නම් අයිතිය නිවැරදි කර පෙන්වන ලෙස දන්වා යවමු.

ඒ අනුව මේ සම්බන්ධයෙන් පරික්ෂා කර අවශ්‍ය ඉදිරි කටයුතු ඉටුකිරීම සුදුසු බවට තීරණය විය.

**<u>03.5 නව වරිපනම් අංකයක් ලබා ගැනීම.</u>**

අලව්ව ප්‍රාදේශීය ලේකම් සතු දවටගොල්ලහේන නමැති රජයේ ඉඩම (පර්. 06) වාර්ෂික බදු පදනම යටතේ බදු ගෙන ඇති බවත් එකී ඉඩමේ අලව්ව බොජුන්හල නමින් ව්‍යාපාරයක් 2020 වර්ෂයේ සිට පවත්වාගෙන යන අතර එහි විදුලිය හා නල ජල බිල්පත් ද තමා නමින් ඇති අතර එකී බොජුන්හලට නව වරිපනම් අංකයක් ලබා දෙන මෙන් ඉල්ලීමක් කරමින් කැබැල්ලවිට, අලව්ව ලිපිනයේ පදිංචි බී.ආර්.ඒ.කේ. ගුණසේන මහත්මිය විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මීට කලින් සභාව සතු ඉඩමක විසිතුරු මසුන්  ඇති කිරීමට ඉල්ලීමක් පැමිණියා. මේ වන විට එම ඉඩම විකිණීමටත් උත්සාහයක් දරනවා. විසිතුරු මසුන් හදන බවට පවසා අපෙන් ඉඩම පවරාගෙන අපිව නොමඟ යවා තිබෙනවා. මෙම කාරණාවේදීත් එවැනි අයිතියක් හදාගෙන වරිපනම් අංකයක් ලබා දීමෙන් ඉදිරියේදී යම් ගැටළු මුහුණ දීමට සිදුවේවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම ඉඩමට යාබදව තිබෙන අනෙකුත් රජයේ ඉඩම් සදහාත් එසේ වරිපනම් අංක ලබා දී තිබෙනවා නම් මෙම ඉඩමටත් වරිපනම් අංකයක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනිඑච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, වරිපනම් අංකයක් ඉල්ලා සිටීම තමාගේ අයිතියේ නීත්‍යානුකූල භාවය තහවුරු කරගැනීමට සිදු කරන උත්සාහයක් බව පෙනී යනවා. එම නිසා අපි ඒ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු විමසා බලා කටයුතු කලොත් හොඳ බවයි මගේ හැඟීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ක්‍රමවේදය පැහැදිලිවම ඉදිරියේදී ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රමවේදයක් බව පෙනෙනවා. මෙම ලිපිලේඛන සමඟ නීති මඟට ගියහොත් ඉඩමේ අයිතිය ලබා දීමට සිදු වෙනවා. එම නිසා මෙම ඉල්ලීමට මම නම් විරුද්ධයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, වරිපනම් අංකයක් ලබා ගැනීම යනු පෞද්ගලික අයිතිය තහවුරු කර ගැනීමට කරන උත්සාහයක් බව පෙනී යන බැවින් එය ලබා නොදීම සුදුසු බවට මා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙතෙක් කාලයක් අපි සභාවක් ලෙස රජයේ ඉඩම් සම්බන්ධයෙන් විවිධ ප්‍රශ්න වලට මුහුණ දී තිබෙනවා. දැනට මෙම ඉඩමේ හෙළ බොජුන්හලක් පවත්වාගෙන යනවා නම් එය අයත් වන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවටයි. එවිට අලව්ව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා මෙම කටයුත්ත කෙරෙනවා නම් මහජන නියෝජිතයින් ලෙස මෙයට කිසිවෙක් විරුද්ධ වන්නේ නැහැ. නමුත් පුද්ගලයෙකුගේ නමට වරිපනම් අංකයක් ලබා දීම බරපතල බේදවාචකයක ආරම්භයක් වෙනවා. මෙම ඉඩම වාණිජමය වටිනාකමක් තිබෙන ඉඩමක් ලෙස එය සභාවට පවරා දිය යුතු බවයි මගේ අදහස. එවිට කඩ කාමර ටිකක් හදා ව්‍යාපාරිකයින් කිහිපදෙනෙකුට එවා බදු දීමෙන් සභාවට නව ආදායම් මාර්ගයක් සකස් කර ගැනීමට අවස්ථාවක් ලැබෙනවා. මෙය රජයට අයත් දේපලක් ලෙස එය සුරැකීමේ වගකීම අපට තිබෙනවා.

ඒ අනුව අදාල ඉඩම රජය සතු ඉඩමක් බැවින් වරිපනම් අංකයක් ලබාදීම සිදුකළ නොහැකි බවට තීරණය විය.

**04. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>**

**05. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**(05-1)<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 01 දරණ යෝජනාව</u>**

ගලේකඩේ, වෙන්නොරුව ලිපිනයේ පදිංචි කේ.පී.ඩී. කරුණාරත්න මහතා විසින් යොමු කර ඇති ලිපියට අනුව තමා අසනීප තත්වයෙන් පසුවන නිසා රැකියාවක් කිරීමට නොහැකි බවත් දරුවන්ගේ අසනීප තත්වයන් ආදිය නිසා දැඩි ආර්ථික දුෂ්කරතාවයකට පත්ව ඇති හෙයින් තමා ව වරිපනම් මුදලින් නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ග්‍රාම නිලධාරී සහ සමෘද්ධි නිලධාරී විසින් ද ඔහු අඩු ආදායම්ලාභියෙකු ලෙස තහවුරු කර තිබෙනවා. ආදායම් පරීක්ෂක නිලධාරීතුමියගේ වාර්තාවට අනුව මොවුන් පදිංචි නිවස නිසි ලෙස නිමකර තිබුනත් එම මහතාගේ සහ දරුවන්ගේ අසනීප තත්වයන් නිසා නිසි ආදායම් මාර්ගයක් නොමැති බව තහවුරු වූ බවත් එම නිසා වරිපනම් බදු මුදල් ගෙවීම සම්බන්ධව සහනයක් ලබා දීම සුදුසු බවටත් වාර්තා කර තිබෙනවා. මේ පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගලේකඩේ, වෙන්නොරුව ලිපිනයේ පදිංචි කේ.පී.ඩී. කරුණාරත්න මහතා හට වරිපනම් බදු මුදල් ගෙවීමෙන් නිදහස් කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ගලේකඩේ, වෙන්නොරුව ලිපිනයේ පදිංචි කේ.පී.ඩී. කරුණාරත්න මහතා හට වරිපනම් බදු මුදල් ගෙවීමෙන් නිදහස් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 02 දරණ යෝජනාව</u>**

විදුලි කාර්මික රාජකාරී කටයුතු වල නිරත වී සිටි ඊ.ඒ.කේ. එදිරිසිංහ මහතා විශ්‍රාම යාම සහ මුරකරු සේවයේ නිරත සේවක මහතුන් දෙදෙනෙකු විශ්‍රාම යාම මත එම කටයුතු ඉටු කර ගැනීම අපහසු වී

ඇති බැවින් සේවා ගිවිසුම් පදනම මත විදුලි කාර්මික මහතෙකු සහ මුරකරු මහතෙකු සේවයට බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව සේවා ගිවිසුම් පදනම මත විදුලි කාර්මික මහතෙකු සහ මුරකරු මහතෙකු සේවයට බඳවා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 03 දරණ යෝජනාව</u>**

නවීන තාක්ෂණයත් සමඟ කාර්යාල කටයුතු පවත්වාගෙන යාම දැනට බොහොමයක් ආයතන මගින් ඉටු කරමින් පවතින බැවින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ 2022.02.08 දිනැති ලිපියෙන් සඳහන් කර ඇති පළාත් පාලන ආයතන ස්වයංක්‍රීයකරණය කිරීමේ වැඩසටහන යටතේ CAT 2020 මෘදුකාංගය අප ප්‍රාදේශීය සභාවේ කාර්යාල කටයුතු සඳහා යොදාගැනීමටත් ඒ සඳහා වැය වන වියදම් දැරීම සුදුසු බවත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පළාත් පාලන ආයතන ස්වයංක්‍රීයකරණය කිරීමේ වැඩසටහන යටතේ CAT 2020 මෘදුකාංගය අප ප්‍රාදේශීය සභාවේ කාර්යාල කටයුතු සඳහා යොදාගැනීමටත් ඒ සඳහා වැය වන වියදම් දැරීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**(05-4)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 04 දරණ යෝජනාව</u>**

දිවුල්ගහකොටුව, මහරච්චිමුල්ල පදිංචි ටී.ඒ. ධනංජය සම්පත් ප්‍රියදර්ශන යන අය වරකාපොල කාර්මික විද්‍යාලයෙහි තොරතුරු තාක්ෂණ ශිල්පී පාඨමාලාව හදාරන ලද බවත් එම පාඨමාලාවට අදාල ප්‍රායෝගික පුහුණුව අලව්ව ප්‍රාදේශීය සභාව මගින් සපුරා ගැනීමට අපේක්ෂාවෙන් සිටින බැවින් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇති අතර එම පුහුණු කාලය තුලදී දිනකට රු. 500.00 ක දීමනාවක් ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව දිවුල්ගහකොටුව, මහරච්චිමුල්ල පදිංචි ටී.ඒ. ධනංජය සම්පත් ප්‍රියදර්ශන යන අය සඳහා එම අයගේ පාඨමාලාවට අදාල ප්‍රායෝගික පුහුණුව අලව්ව ප්‍රාදේශීය සභාව මගින් සපුරා ගැනීමට අවස්ථාව ලබා දීම සුදුසු බවටත් එම පුහුණු කාලය තුලදී දිනකට රු. 500.00 ක දීමනාවක් ගෙවීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 05 දරණ යෝජනාව</u>**

හුම්බුළුව, අලව්ව ලිපිනයේ පදිංචි එම්. පී. ජිනේන්ද්‍රා පතිරණ මහත්මිය විසින් යොමු කර ඇති ලිපියට අනුව ඇයගේ ඉඩමෙහි 417/1, වඩුමඩුව යන ගොඩනැගිල්ල එම ස්ථානයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇති බවත් එය වරිපනම් ලේඛනයෙන් ඉවත් කර දෙන ලෙසත් ඉල්ලීමක් කර තිබෙනවා. ආදායම් පරීක්ෂක මහතා විසින් ස්ථාන පරීක්ෂණයක් සිදු කර ඇති අතර තක්සේරු ලේඛනයේ ඇති ආකාරයට දේපලක් නොමැති බව වාර්තා කර ඇති බැවින් එම දේපල හා වරිපනම් අංකය වරිපනම් ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව හුම්බුළුව, අලව්ව ලිපිනයේ පදිංචි එම්. පී. ජිනේන්ද්‍රා පතිරණ මහත්මියගේ දේපල හා වරිපනම් අංකය වරිපනම් ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-6)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 06 දරණ යෝජනාව</u>**

වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් යොමු කර ඇති ලිපියට අනුව වයඹ පළාත තුල පිහිටා ඇති සියළු ඇල රක්ෂිත 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පණතේ 04 (අ) 1 වගන්තිය යටතේ ගරු වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කල යුතුව ඇති බැවින් මෙම කාර්යය කඩිනමින් නිම කිරීම පිණිස වයඹ පළාත තුල පිහිටි සියළු පළාත් පාලන ආයතන වල එකඟත්වය ලබා ගැනීමට අදහස් කර ඇත. ඒ අනුව අප පළාත් පාලන ආයතන බල සීමාව තුල පිහිටි ජලය බැස යාමට සලස්වා ඇති හෝ ජලය බැස යාමේ අරමුණින් නිර්මාණය කර ඇති හෝ ස්වභාවික සියළු ඇල මාර්ග, සියළු අතුරු ඇල මාර්ග හා සියළු පෝෂිත ඇල මාර්ගයන් හි මතුපිට පළල අනුරූප වන සේ පහත ලේඛනයේ දක්වා ඇති පරිදි ඉවුරු දෙකෙහිම ඉවුරේ මායිමේ සිට දුර ප්‍රමාණයක් රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් අප පළාත් පාලන ආයතනයේ කැමැත්ත ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් කර ඇත.

| ඇලෙහි මතුපිට පළල (මීටර්) | ඇල ඉවුරේ මායිමේ සිට රක්ෂිතය | |
|---|---|---|
| | විවෘත ඇල සඳහා (මීටර්) | මතුපිට ආවරණය කරන ලද ඇල සඳහා (මීටර්) |
| 1.0 - 1.2 දක්වා | 1.0 | 0.3 |
| 1.3 - 3.0 | 2.0 | 1.0 |
| 3.1 - 4.5 | 2.75 | 1.0 |
| 4.6 - 6.0 | 3.5 | 1.5 |
| 6.1 - 9.0 | 4.5 | 1.5 |
| 9.0 ට වැඩි | 6.5 | 2.0 |

මෙම රක්ෂිත සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන විසින් ප්‍රකාශ කර ඇති දුර ප්‍රමාණය මෙම ප්‍රකාශයේ රක්ෂිත ප්‍රමාණයන්ට වැඩි වන අවස්ථාවක එම ආයතන විසින් ප්‍රකාශ කරනු ලබන රක්ෂිත බලපැවැත්වෙනු ඇත. (සංශෝධිත පණතේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අප බලප්‍රදේශය තුල තිබෙන ප්‍රාදේශීය සභාව සතු මාර්ග බොහොමයක් දිවෙන්නේ ඇළ අයින් දිග ඇලත් සමඟයි. මේ ආකාරයට රක්ෂිතය නම් කරන විට එම රක්ෂිතයට ඇල දෙපැත්තම අයත් වෙනවා. එවිට අපේ ප්‍රාදේශීය සභා මාර්ග වල දෙකෙන් පංගුවකටත් වැඩි ප්‍රමාණයක් එම රක්ෂිතයටයි අයත් වන්නේ. එවිට මතු කාලයේදී අපිට අර්බුධකාරී මුහුණ දීමට සිදු වෙනවා. මේ පිළිබඳව අවධානය යොමු නොකර මෙය සම්මත කර යැවීමෙන් යම් යම් ගැටළු ඇතිවිය හැකියි. එම නිසා සංශෝධන සහිතව හෝ මෙය යැවිය හැකි නම් අනුමැතිය දීම සුදුසු බව මගේ අදහසයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙම යෝජනාවේ දෙපැත්තක් තිබෙනවා. චමින්ද මන්ත්‍රීතුමා පැවසුවා මෙන්ම අපි මෙම යෝජනාව යැවිය යුත්තේ සංශෝධන වලට යටත්වයි. මෙහි ඉතා හොඳ පැත්තකුත් තිබෙනවා. අලව්ව නගරයේ සිට ගමන් කරන ඇල මාර්ගයේ කලකට පෙර ඇල රක්ෂිතයක් තිබුනා. නමුත් දැන් එම ඇල රක්ෂිතයේ කඩවල් සාදා තිබෙනවා. මෙම ඇල රක්ෂිතය නොමැති වීමෙන් විශාල වතුර පාරක් පැමිණි විට එය නගරය හරහා ගමන් කරනවා. එදා තිබුනු ඇල රක්ෂිතය අද වන තුරුත් ආරක්ෂා වී තිබුනා නම් එම තත්වය ඇතිවන්නේ නැහැ. මෙසේ රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම තුලින් ගොවීන්ට ඇල මාර්ගයට තිබෙන පරම අයිතිය රැක ගැනීමට අවස්ථාව ලබා දී තිබෙනවා. අපගේ කැමැත්ත ප්‍රකාශ කර යවන විට ඇල මාර්ග අසල ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් තිබේ නම් එම මාර්ග පද්ධතියට කිසිදු හානියක් හෝ බලපෑමක් නොවන ආකාරයට කටයුතු කරනවා නම් මේ සම්බන්ධයෙන් අපගේ කිසිදු විරෝධතාවයක් නොමැති බව මා ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,රජයේ ප්‍රධාන අමාත්‍යාංශයක් ලෙස මෙය වගකිවයුතු නිලධාරීන් සාකච්ඡා කර ගනු ලැබූ තීරණයක් විය යුතුයි. මෙවැනි රක්ෂිත ප්‍රකාශයට පත් කර ඒවා රජයට පවරා ගත යුතුයි. එසේ පවරාගෙන නොතිබුනහොත් අනාගතයේදී මෙම ඇල මාර්ග ගමන් කරන්නේ පෞද්ගලික ඉඩම් හරහායි. අද වන විට රක්ෂිතයන් බොහොමයක් පෞද්ගලිකව පරිහරණය කරනු දක්නට ලැබෙනවා. මෙසේ රක්ෂිතයන් ප්‍රකාශයට පත් කිරීම හොඳයි. කෙසේ වෙතත් එය කල යුත්තේ සංශෝධන සහිතවයි. ඒ අනුව මෙයට සංශෝධන වලට යටත්ව අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා. ප්‍රාදේශීය සභාවටත්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන දේපල වලටත් හානියක් නොවන ලෙස ක්‍රියාත්මක වෙනවා නම් මෙම ක්‍රමවේදය හොඳයි. මාබෝපිටිය සිට නැබඩවතුර දක්වා යන මහ ඇලත් අග්බෝව සිට තුඹුල්ල හරහා යන මහ ඇලත් යන දෙකේ අද තිබෙන්නේ ඉතා කුඩා නියරක් පමණයි. එම කොටසේත් පොල්ගස් සිටුවා තිබෙනවා. එම නිසා මෙසේ රක්ෂිතයක් නම් කිරීමේ වාසියක් තිබෙනවා. මේ තුලින් අවාසියක් සිදු වන්නේ ප්‍රාදේශීය සභා මාර්ග වලටයි. එම නිසා අපගේ කැමැත්ත ප්‍රකාශ කර යවන විට ප්‍රාදේශීය සභා මාර්ග වලට හානියක් නොවන ආකාරයට එය සිදු කරන ලෙස සඳහන් කර යවන්න. එමෙන්ම තවත් ඉල්ලීමක් තිබෙනවා. එනම් කුඹුරු හරහා යන ප්‍රාදේශීය සභා මාර්ග වලට වෙනත් බොරු නියරක් දමා මාර්ගය ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලීමක් කරන්න. මෙම මාර්ග රැකදීම අපේ යුතුකමක් වනවා. ඒ අනුව සංශෝධන වලට යටත්ව ඇල රක්ෂිත නම් කිරීම සුදුසු බවට මම ද ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අපේ බල ප්‍රදේශයේ බොහොමයක් මාර්ගවල එක් පැත්තක තිබෙන්නේ ඇලයි. අනෙක් පැත්තට තිබෙන්නේ කුඹුරුයි. කුඹුර පැත්තෙන් ටිකෙන් ටික කැපෙනවා. එවිට කාලයක් යන විට අපිට මාර්ගයක් නැතිව යනවා. මාර්ග සංවර්ධනය කරන්නට යාමේදී අපි මෙම ගැටළු වලට මුහුණ දෙනවා. එසේ නම් සංශෝධන වලට යටත්ව ප්‍රාදේශීය සභා මාර්ග වලට හානියක් නොවන පරිදි ඇල රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමට අප ප්‍රාදේශීය සභාවේ කැමැත්ත ලබා දීමට කටයුතු කරමු.

ඒ අනුව සංශෝධන වලට යටත්ව ප්‍රාදේශීය සභා මාර්ග වලට හානියක් නොවන පරිදි ඇල රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමට අප ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-7) ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 07 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක RX – 0644 දරන ජල බවුසරය සඳහා අවශ්‍ය 750 X 16 X 16PR ප්‍රමාණයේ ටයර්, ටියුබ් සහ කොලර් මිලදී ගැනීම සඳහා පහත මිල ගණන් ඉදිරිපත් කර ඇත. අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක RX – 0644 දරන ජල බවුසරයෙන් ජල සේවාවන් සැපයීම සඳහා සේවා ලාභීන්ගෙන් මුදල් අය කර ඇති නමුත් සේවාවන් සැපයීමට ඇති ස්ථාන 2 ක් පවතින බැවින් සහ පවතින නියං තත්වය මත කඩිනමින් එම සේවාවන් සැපයිය යුතු බැවින් දැනට පවතින වියළි කාලගුණ තත්වය නිසා ජල බවුසරය සඳහා ඉල්ලීම් විශාල වශයෙන් ලැබෙමින් පවතින බැවින් කඩිනමින් එහි ටයර් මිලදී ගැනීමට සිදුවී ඇත. එනිසා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති රත්නපුර, නිවිතිගල සහ කොළඹ වැනි දුර ආයතන වලින් ප්‍රවාහනය කර ගැණීමේදී වැඩි කාලයක් සහ වියදමක් දැරීමට සිදුවන බැවින් අලව්ව අවට අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති උයන්වත්ත, නාරම්මල ලිපිනයේ පවත්වාගෙන යනු ලබන බටේපොල ටයර් හවුස් ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ,ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | | | |
|---|---|---|---|---|---|---|
| | | අනුර ටයර් (ප්‍රයිවට්) ලිමිටඩ්, නො. 151, කොළඹ පාර, රත්නපුර | **ද ටයර් ස්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, නො.27 කලවාන පාර, නිවිතිගල** | **සුම්ඩැග් ටයර් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්, මීගමු පාර මල්කඩුවාව, කුරුණෑගල** | ක්‍රවුන් ටයර් (පුද්) සමාගම,155 සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 | **බටේපොල ටයර් හවුස්, කුරුණෑගල පාර, උයන්වත්ත, නාරම්මල** |
| 01 | 750 X 16 X 16PR ප්‍රමාණයේ ටයර් | 25125.00 | 25795.00 | 28521.00 | 22700.00 | 26900.00 |
| 02 | 750 X 16 X 16PR ප්‍රමාණයේ ටියුබ් | 2450.00 | 2825.00 | 2425.00 | 1890.00 | 2400.00 |
| 03 | 750 X 16 X 16PR ප්‍රමාණයේ කොලර් | නැත | නැත | නැත | නැත | 550.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ වමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ අංක RX – 0644 දරන ජල බවුසරය සඳහා අවශ්‍ය 750 X 16 X 16PR ප්‍රමාණයේ ටයර්, ටියුබ් සහ කොලර් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති උයන්වත්ත, නාරම්මල ලිපිනයේ පවත්වාගෙන යනු ලබන බටේපොල ටයර් හවුස් ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-8) ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 08 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන නිළධාරී රාජකාරී කරනු ලබන ඩෙස්ක්ටොප් පරිගණකය 4GB RAM එකක් යොදා අළුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.60, නුවර පාර, කුරුණෑගල ලිපිනයේ පවත්වාගෙන යනු ලබන හේමැක්ස් කම්පියුටර්ස් ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව අළුත්වැඩියාව සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | ඩි කැපිටල් ටෙක්නොලොජීස්, නො.58, නුවර පාර, කුරුණෑගල | හේමැක්ස් කම්පියුටර්ස්, නො.60, නුවර පාර, කුරුණෑගල | කේ.සී.ඔෆිස් ඔටෝමේෂන්, නො.94, ලින්ක්වුඩ් ප්ලේස්, කොළඹ පාර, කුරුණෑගල |
| 01 | **DDR4 4GB RAM එකක් අළුතින් දැමීම** | **රු.8500.00** | **රු.7500.00** | **රු.7950.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන නිළධාරී රාජකාරී කරනු ලබන ඩෙස්ක්ටොප් පරිගණකය 4GB RAM එකක් යොදා අළුත්වැඩියා කිරීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.60, නුවර පාර, කුරුණෑගල ලිපිනයේ පවත්වාගෙන යනු ලබන හේමැක්ස් කම්පියුටර්ස් ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව අළුත්වැඩියාව සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-9) <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 09 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ අලව්ව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇති හලරය සඳහා කම්බි දැලක් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.93, වෙලගෙදර වීදිය, කුරුණෑගල ලිපිනයේ පවත්වාගෙන යනු ලබන කලම්බු හාඩ්වෙයර් ස්ටෝර්ස් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | ඔලිම්පික් හාඩ්වෙයර්, නො.71, මහවීදිය, අලව්ව. | කලම්බු ජේන්ට් සෙන්ටර්, 75, වෙලගෙදර වීදිය, කුරුණෑගල | කලම්බු හාඩ්වෙයර් ස්ටෝර්ස්, නො.93, වෙලගෙදර වීදිය, කුරුණෑගල |
| 01 | අලව්ව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇති හලරය සඳහා කම්බිදැල් අඩි 01 ක් (නො.06 ගේජ් 19) | **රු.575.00** | **රු.520.00** | **රු.497.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇති හලරයට කම්බි දැලක් මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.93, වෙලගෙදර වීදිය, කුරුණෑගල ලිපිනයේ පවත්වාගෙන යනු ලබන කලම්බු හාඩ්වෙයර් ස්ටෝර්ස් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-10)** <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/48 - 10** දරණ යෝජනාව</u>
අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය පාදයෙන් ක්‍රියාකරනු ලබන රඳවනය සහිත අත සෝදන බේසම් (Padal Type Sink With Stand) සඳහා රු.12000.00 ක් වන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.55, මහවීදිය, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක කේ.එස්. ද සිල්වා ඇන්ඩ් සන් ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | ආර්.බී.එස්.ට්‍රේඩිං සමාගම, නො.61, ඩී.බී.වෙලගෙදර වීදිය, කුරුණෑගල | කේ.එස්. ද සිල්වා ඇන්ඩ් සන්, 55, මහ වීදිය, කුරුණෑගල | ඩබ්.ඩී.මැනුවල් අප්පුහාමි ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්, නො.54-56, ඩී.බී.වෙලගෙදර වීදිය, කුරුණෑගල |
| 01 | **පාදයෙන් ක්‍රියාකරනු ලබන රඳවනය සහිත අත සෝදන බේසම් (Padal Type Sink With Stand)** | **රු.12450.00** | **රු.12000.00** | **රු.13000.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය පාදයෙන් ක්‍රියාකරනු ලබන රඳවනය සහිත අත සෝදන බේසම් (Padal Type Sink With Stand) සඳහා රු.12000.00 ක් වන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නො.55, මහ වීදිය, කුරුණෑගල ලිපිනයේ ක්‍රියාත්මක කේ.එස්. ද සිල්වා ඇන්ඩ් සන් ආයතනය මගින් ආවරණ අනුමැතියට යටත්ව මිලදී ගැනීම සිදුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-11)**<u>ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා විසින් කරනු ලබන අංක **06/48 - 11** දරණ යෝජනාව</u>
වඩුවාව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දංගොල්ලවත්ත මාර්ගය අලව්ව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව වඩුවාව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දංගොල්ලවත්ත මාර්ගය අලව්ව ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-12)** <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 12 දරණ යෝජනාව</u>

2021 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද අලව්ව මාරගල්කන්ද ජල ව්‍යාපෘතියේ ජල නළ එළීම ඉදි කිරීම වැඩ විෂයේ අවසන් ගෙවීමට අදාල රු. 1,668, 245.85 ක මුදල වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය මගින් එවා ඇති අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් අදාල ගෙවීම සැනොකි එන්ටප්‍රයිසස් වෙත ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම ව්‍යාපෘතිය ඉතාමත් හොඳින් සිදු වී තිබෙනවා. මේ පිළිබඳව ජනතාව දැනුවත් කර තිබුනෙත් නැහැ. මේ සඳහා ප්‍රාදේශීය සභාව මගිනුත් විශාල මුදලක් යොදවා තිබෙනවා. එම නිසා දිනයක් යොදාගෙන මෙම ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කරමු.

ඒ අනුව 2021 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද අලව්ව මාරගල්කන්ද ජල ව්‍යාපෘතියේ ජල නළ එළීම ඉදි කිරීම වැඩ විෂයේ අවසන් ගෙවීමට අදාල රු. 1,668, 245.85 ක මුදල සැනොකි එන්ටප්‍රයිසස් වෙත ගෙවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-13)** <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 13 දරණ යෝජනාව</u>

වාර්ෂිකව සුනඛයින් එන්නත් කිරීමේ වැඩසටහන මෙම වර්ෂයේ ද ක්‍රියාත්මක කිරීමට කටයුතු සංවිධානය වෙමින් පවතින අතර, ඒ සම්බන්ධ සාකච්ඡාමය වැඩසටහනක් 2022.02.24 දින ගරු සභාපතිතුමියගේ ප්‍රධානත්වයෙන් අලව්ව ප්‍රාදේශීය සභා නගර ශාලාවේ දී කුරුණෑගල ජලභීතිකා මර්දන ඒකකය සහ අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සහභාගීත්වයෙන් පැවැත්විනි. එහිදී වැඩසටහන සම්බන්ධව කරුණු ඉදිරිපත් කළ අතර, මෙම වැඩසටහන අප්‍රේල් මස මුල සිට පැවැත්වීමට කටයුතු සංවිධානය වී ඇති බව දන්වා සිටියහ. ඒ අනුව පහත සඳහන් ද්‍රව්‍ය එම දිනට කලින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස වැඩිදුරටත් ඉල්ලා සිටියි. එබැවින් පහත ද්‍රව්‍ය ලබා ගැනීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

- ඉන්ධන 400l
- පෝස්ටර් 1000
- අත්පත්‍රිකා 7500
- කරපටි 8000
- හෙල්මට් ලොක් 8000

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත ද්‍රව්‍ය ලබා ගැනීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-14) ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 14 දරණ යෝජනාව**

ජල හා සනීපාරක්ෂක විෂය යටතේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව මාර්තු මාසය තුල ගර්භණී මාතාවන් සඳහා දැනුවත් කිරීමේ සහ පෝෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙකී වැඩසටහනනේ මව්වරුන් තෝරා ගැනීම ගරු මන්ත්‍රීවරුන් හරහා සිදු කිරීමට යෝජනා වී ඇත. එබැවින් එක් මන්ත්‍රීවරයෙක් සඳහා එක් මවක් (අඩු ආදායම්ලාභී වන පරිදි) වශයෙන් මව්වරු 28 දෙනෙක් තෝරා දෙන ලෙස ඉල්ලීමක් කරන අතර අදාල මවගේ නම, ලිපිනය සහ කොට්ඨාශය සඳහන් කරමින් 2022.03.15 දිනට පෙර සභාව වෙත ලැබීමට සලස්වන ලෙස ඉල්ලා සිටිනවා. (මව්වරුන්ගේ නාම ලේඛනය ලබා දීමට ප්‍රමාද වන්නේ නම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා මව්වරුන් තෝරා ගැනීමට සිදුවන බව ද දන්වා සිටිමි.) මෙම වැඩසටහනේ මව්වරුන් 28 දෙනා සඳහා රු. 2000 ක් වටිනා පෝෂණ මල්ලක් සහ රු. 2000 ක් වටිනා ළදරු ඇඳුම් කට්ටලයක් ලබා දීමට 2022.02.23 දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේදී හා 2022.03.02 දින පවත්වන ලද මුදල් කමිටුව මගින් තීරණය කර ඇති නමුත් වෙළඳපලේ වර්තමානයේ පවතින මිල ගනන් වෙනස්වීම මත රු. 4100.00 ක් වටිනා බඩු මලු ලබා දීමට සැලසුම් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රජා සංවර්ධන අංශය මගින් සැලසුම් කර ඇති පරිදි ගර්භනී මාතාවන් සඳහා දැනුවත් කිරීමේ සහ පෝෂණ වැඩසටහනක් පැවැත්වීම සඳහාත් එම වැඩසටහනේ මව්වරුන් 28 දෙනා සඳහා රු. 4100.00 ක බඩු මලු ලබා දීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ප්‍රජා සංවර්ධන අංශය මගින් සැලසුම් කර ඇති පරිදි ගර්භනී මාතාවන් සඳහා දැනුවත් කිරීමේ සහ පෝෂණ වැඩසටහනක් පැවැත්වීම සඳහාත් එම වැඩසටහනේ මව්වරුන් 28 දෙනා සඳහා බඩු මලු ලබා දීම සඳහාත් අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-15) ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 15 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු පහත තනතුරු වල ස්ථිර සේවයේ නියුතු සේවකයින්ට වාර්ෂිකව ලබා දෙනු ලබන රු.4000/= නිල ඇඳුම් දීමනාව ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

- සෞඛ්‍ය කම්කරු
- මාර්ග කම්කරු
- කාර්යාල කම්කරු
- මුරකරු
- පුස්තකාල සහායක
- රියදුරු
- ආයුර්වේද කම්කරු
- ප්‍රජාශාලා කම්කරු

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ වාර්ෂිකව ලබා දෙනු ලබන රු.4000/= නිල ඇඳුම් දීමනාව ඉහත තනතුරුවල නිරත සේවකයින් සඳහා ගෙවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-16)** **<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 16 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෝරාගත් ගර්භණී මව්වරුන් සඳහා ළදරු ඇඳුම් කට්ටල ලබාදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් අලව්ව, ජයන්ත ටෙක්ස්ටයිල් ආයතනය මගින් ඉදිරිපත් කර තිබුනද එම ආයතනයෙහි අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත් තරම් මිලදී ගැනීමට නොමැති බැවින් මහ වීදිය, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක කවිෂ්ක පැෂන් වෙතින් අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | **කළමනාකරු, කවිෂ්ක පැෂන්, මහ වීදිය, අලව්ව** | **කළමනාකරු, ජයන්ත ටෙක්ස්ටයිල්, අලව්ව** | **කළමනාකරු, වැවල ටෙක්ස්ටයිල් අලව්ව** |
| 01 | **ළදරු ගවුම් (ගවුම් 6 පැකට් එකක මිල)** | **රු.225.00** | **රු. 210.00** | **රු.350.00** |
| 02 | **නැපි (නැපි 12 පැකට් එකක මිල) 22 X 22** | **රු.800.00** | **රු. 860.00** | **රු.800.00** |
| 03 | **පැනල් ( පැනල් 02 පැකට් එකක මිල) 36 X 36** | **රු.650.00** | **රු. 660.00** | **රු.700.00** |
| 04 | **නැපි (නැපි 06 පැකට් එකක මිල) 18 X 18** | **රු.325.00** | **රු. 190.00** | **රු.350.00** |
| එකතුව | | **රු.2000.00** | **රු.1920.00** | **රු.2200.00** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ගර්භණී මව්වරුන් සඳහා ළදරු ඇඳුම් කට්ටල ලබාදීමට අවශ්‍ය ද්‍රව්‍ය මහ වීදිය, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක කවිෂ්ක පැෂන් වෙතින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-17)** **<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 17 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෝරාගත් ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතුරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති වාරියගොඩ, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක ජයතිස්ස ස්ටෝර්ස් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | කළමනාකරු, ජයතිස්ස ස්ටෝර්ස්, වාරියගොඩ, අලව්ව. | කළමනාකරු, දීපා ස්ටෝර්ස්, මහ වීදිය, අලව්ව | කළමනාකරු, දිමුතු ස්ටෝර්ස්, මහ වීදිය, අලව්ව |
| 01 | කව්පි - 500g | රු. 305.00 | රු.280.00 | රු.300.00 |
| 02 | හාල්මැස්සන් - 250g | රු. 200.00 | රු.191.25 | රු.194.00 |
| 03 | පරිප්පු (M) -1 Kg | රු. 315.00 | රු.305.00 | රු.305.00 |
| 04 | කඩල - 500g | රු.320.00 | රු.346.00 | රු.323.00 |
| 05 | රතු සීනි 1 Kg | රු.170.00 | රු.161.00 | රු.158.00 |
| 06 | සෝයා මීට් - පැ.01 | රු.75.00 | රු.45.00 | රු.32.00 |
| 07 | නූඩ්ල්ස් - පැ.01 | රු.70.00 | රු.135.00 | රු.140.00 |
| 08 | ඉදිආප්ප පිටි - පැ. 01 | රු.184.00 | රු.188.00 | රු.190.00 |
| 09 | නෙස්ටමෝල්ට් - 400 g | රු.410.00 | රු.430.00 | නැත |
| එකතුව | | රු. 2049.00 | රු. 2081.25 | රු.1642.00 (නෙස්ටමෝල්ට් නොමැතිව) |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීමට අවශ්‍ය ද්‍රව්‍ය අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති වාරියගොඩ, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක ජයතිස්ස ස්ටෝර්ස් ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-18)** <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 18 දරණ යෝජනාව</u>

කිරිවානාපොල, මහරව්විමුල්ල පදිංචි එන්.පී. ලාල් ප්‍රේමසිරි මහතා විසින් යොමුකර ඇති ලිපියට අනුව වරිපනම් අංක 179 යටතේ වසර ගණනාවක් අඛණ්ඩව වරිපනම් බදු ගෙවාගෙන ආ නමුත් මෙම වසරේ වරිපනම් බදු මුදල රු. 980 ක් වී ඇති බවත් තමා හා තමාගේ බිරිඳ අසනීප තත්වයෙන් පසුවන නිසා රැකියාවක් කිරීමට ද නොහැකි බැවින් වරිපනම් බදු මුදල ගෙවා ගැනීමට නොහැකි බවත් එම නිසා වරිපනම් බදු මුදල් ගෙවීමෙන් නිදහස් කරන ලෙසත් ඉල්ලීමක් කර තිබෙනවා. ආදායම් පරීක්ෂක වාර්තාවට අනුව වරිපනම් අංක 179 හිමි එන්.පී. ලාල් ප්‍රේමසිරි මහතා අංශභාග රෝග තත්වයෙන් පෙලෙන අතර ඔහුගේ බිරිඳ ද අසනීප තත්වයෙන් පසුවන බවත් අඩු ආදායම්ලාභී පවුලක් වන නිසා වරිපනම් බදු නිදහස් කිරීම හෝ අඩු කිරීම සුදුසු බවට වාර්තා කර තිබෙනවා. මේ පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ් මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, කිරිවානාපොල, මහරව්විමුල්ල ලිපිනයේ පදිංචි එන්.පී. ලාල් ප්‍රේමසිරි මහතාට අයත් වරිපනම් අංක 179 දරණ දේපලට අදාල වරිපනම් බදු මුදලින් නිදහස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව කිරිවානාපොල, මහරව්විමුල්ල ලිපිනයේ පදිංචි එන්.පී. ලාල් ප්‍රේමසිරි මහතාට අයත් වරිපනම් අංක 179 දරණ දේපලට අදාල වරිපනම් බදු මුදලින් නිදහස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**(05-19) ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 19 දරණ යෝජනාව**

ගම සමඟ පිළිසඳරක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට අදාලව අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත හෙණ්ඩුවාවත්ත වොලිබෝල් ක්‍රීඩා පිටියේ දැල් ආවරණය කිරීම සහ යෝජිත ක්‍රීඩා පිටියේ අවශ්‍ය සංවර්ධන කටයුතු සිදුකිරීමේ (ප්‍රතිපාදන මුදල - රු. 510,000.00) ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන අනුමත කර ඇති බවත් එම ක්‍රීඩා පිටිය ඉදි කිරීමට යෝජිත ඉඩම රජයේ ඉඩමක් වන හෙයින් ඉඩමේ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට එකඟතාවය ලබා දෙන මෙන් අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉල්ලීමක් කර ඇති අතර ඒ සඳහා එකඟතාවය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. මෙය ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ඉල්ලීමක්. මුලදී මෙය රජයේ ඉඩමක් බැවින් ක්‍රීඩා පිටියට ලබා දීමට විරෝධතාවය ප්‍රකාශ කලත් පසුව ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා දැනුවත් කිරීමෙන් පසුව එය ලබා දීමට කටයුතු කලා. ගමේ තරුණ පිරිස වෙනුවෙන් එතුමාට මගේ ගෞරව පූර්වක ස්තූතිය පුද කරනවා. මෙම ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා මේ වන විට ලක්ෂ 13 කට අධික ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. මෙම ක්‍රීඩා පිටිය සංවර්ධනය කරගැනීම සඳහා ඉදිරියේදී ඔබතුමියගේ සහයෝගය, ශක්තිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ෂෙල්ටන් මන්ත්‍රීතුමා මෙම ක්‍රීඩා පිටියේ උන්නතිය වෙනුවෙන් විශාල ප්‍රයත්නයක් සිදු කරනවා. සභාවක් ලෙස එවැනි කටයුත්තක් සිදු කිරීමේදී උපරිම සහයෝගය එතුමාට ලබා දිය යුතු බව ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ෂෙල්ටන් මන්ත්‍රීතුමා විශාල උත්සාහයකින් මෙම ක්‍රීඩා පිටිය ලබා ගැනීමටත් එය සංවර්ධනය කිරීමටත් කටයුතු කරනවා. එතුමාට දිය හැකි සෑම සහයෝගයක්ම ලබා දීමට අපි කටයුතු කරමු.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අපේ මහ සභාවේ එකඟතාවය අනුව යෝජිත ඉඩම රජයේ ඉඩමක් වන හෙයින් එම ඉඩමේ ක්‍රීඩා පිටියක් ඉදි කිරීම සඳහා යොදා ගැනීමට අපේ එකඟතාවය ලබා දෙන බව ප්‍රකාශ කර යවමු.

ඒ අනුව හෙණ්ඩුවාවත්ත වොලිබෝල් ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා එම ඉඩම භාවිතා කිරීමට එකඟතාවය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-20) ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 20 දරණ යෝජනාව**

වදාව ග්‍රාම නිලධාරී වසමේ කුරුණෑගල වැව්ලි සමාගමේ වැලිහිටියාව වත්තේ කළුගල් කැඩීම සඳහා අවසර ඉල්ලා ඇති අතර ප්‍රධාන මාර්ගයේ සිට වැව්ලි සමාගමේ වත්තට මීටර් 400 ක පමණ දුරක් මාර්ගය පිහිටා ඇත. එම මාර්ගයේ තැනින් තැන කොන්ක්‍රීට් දමා ඇති අතර බෝක්කු 02 ක් සහ එක් බෝක්කුවක් උඩින් තැලව්ල්ලක් ඉදි කර ඇත. මෙම මාර්ගයේ සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක් ද පිහිටා ඇති අතර එම මාර්ගය දෙපස නිවාස 10 ක් පමණ පිහිටා ඇත. කළුගල් වල ක්‍රියාත්මක වීමේදී ගල් ප්‍රවාහනය වීම නිසා මාර්ගය භාවිතා කරන්නන් අපහසුතාවයට ලක්විය හැකි බැවින් මහජන විරෝධතාවයක් උද්ගත වීමේ හැකියාවක් ඇත. එම නිසා මාර්ගය භාවිතා කරන්නන් සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීමෙන් අනතුරුව බලපත්‍ර නිකුත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙය දීර්ඝ කාලයක සිට එන ප්‍රශ්නයක්. දැනට වදාව ග්‍රාම නිලධාරී වසම ආසන්නයේ කළුගල් කොරි 06 ක් පමණ තිබෙනවා. මේවා සඳහා එන ටිපර් රථ ප්‍රමාණය නිසා ජනතාව දැනටමත් විශාල පීඩනයකට පත් වී සිටිනවා. කළුගල් කොරි ප්‍රමාණය ප්‍රදේශයට දැරීමට නොහැකි තරම්. ගල කැඩීම පිළිබඳ ප්‍රශ්නයටත් වඩා මාර්ග භාවිතා කිරීම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් පවතිනවා. එම නිසා එයට තවත් ගල් කොරියක් එකතු වුවහොත් එම ප්‍රදේශයට විශාල ප්‍රශ්නයකට මුහුන දීමට සිදුවෙනවා. දිනකට ටිපර් රථ සියයකට වඩා ප්‍රමාණයක් මෙම මාර්ගයේ ගමන් කරනවා. මා ප්‍රකාශ කර සිටින්නේ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය නැවතෙන තුරු හෝ මෙම ගල් කොරිය ස්ථාපිත කිරීමට ඉඩ නොදී සිටිය යුතු බවයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වදාව ප්‍රදේශයේ තිබෙන ගල් කොරි සම්පූර්ණයෙන් නැවැත්විය යුතුයි. මේ වන විට ජනතා නියෝජිතයින් ලෙස අපිටත් චෝදනා එල්ල වෙන තත්වයට පත් වී තිබෙනවා. ගමේ ජනතාවගේ මෙන්ම විහාරස්ථාන වලිනුත් මෙම ගල් කොරි සඳහා දැඩි විරෝධතාවයක් පවතිනවා. මේ වන විට අළුතෙන් ගල් කොරි කිහිපයකටම පර්මිට් දැමීමට සූදානම් වන බවට තොරතුරු තිබෙනවා. මෙම ප්‍රදේශවල වතුර හිඟයක් දැනටම ඇති වී තිබෙනවා. ගම් වල ජනතාව කොතරම් විරෝධතාවය ප්‍රකාශ කලත් ඒවාට විසඳුමක් ලැබුණේ නෑ. මින් ඉදිරියටවත් මේ ප්‍රදේශයේ අළුතින් ස්ථාපිත කරන ගල් වලවල් වලට සම්පූර්ණ විරෝධය ප්‍රකාශ කල යුතුයි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අධිවේගී මාර්ග ඉදි කිරීම වැනි රට තුල සිදු කරන සංවර්ධන කටයුතුවලට කළුගල්, බොරළු ආදිය අවශ්‍ය නිසා ඒවාට විරුද්ධ වෙලත් බෑ. කෙසේ වෙතත් ග්‍රාමීය මට්ටමින් සිදුවන අගතීන් වලදී අපි සිටින්නේ ජනතාවගේ පැත්තේයි. මහජනතාව චෝදනා කරන්නේ අපිටයි. ගමේ ජනතාවත්, විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලාත්, ප්‍රභුවරුත් සමඟ මෙම ගල් කොරිය ස්ථාපිත කිරීමට නියමිත සමාගම විසින් සාකච්ඡා කර ගැටළුවක් නැත්නම් සහ භාවිතා කරන මාර්ගය සකස් කර දීමේ පොරොන්දුව මත අවසර ලබා දීම පිළිබඳ සලකා බැලිය හැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ප්‍රදේශයට ගල් කොරි නිසා දැවැන්ත හානියක් සිදු වී තිබෙනවා. එම ප්‍රදේශයේ ළිං සිඳී ගොස් තිබෙනවා. එමෙන්ම ගල් කොරි වල ගල් කුඩු වැටීම නිසා ළිං වල වතුර බීමට නොහැකි තත්වයක් උදාවී තිබෙනවා. එමෙන්ම මෙම ගල් කුඩු නිසා පොල් ගස් පවා මැරී ගොස් තිබෙනවා. එමෙන්ම ඓතිහාසික පුරාණ රැනගල රජමහා විහාරස්ථානයේ ගොඩනැගිලි සහ චෛත්‍ය රාජයානන් වහන්සේ මෙම ගල් කොරි හේතු කොට ගෙන ඉරිතලා ගොස් තිබෙනවා. ගල් කොරි අවට නිවෙස් වල බිත්ති ද පුපුරා ගොස් තිබෙනවා. මීට අමතරව ගල් ටිපර් ගමන් කිරීම නිසා පාරට විශාල ලෙස හානි වී තිබෙනවා. එමෙන්ම ටිපර් විශාල ප්‍රමාණයක් ගමන් කිරීම නිසා අනතුරුද බහුල වී තිබෙනවා. ඒ අනුව එම කොට්ඨාශයේ කිසිම ගල් කොරියකට අවසර ලබා නොදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, දඹදෙණි ආසනයේ අධිවේගී මාර්ගයේ සංවර්ධන කටයුතු නිම වූ වහාම මෙම ගල් කොරි නැවැත්විය යුතු බවට එකඟතාවයකට පැමිණියා. මේ වන විට දඹදෙණි ආසනයේ එම කටයුතු අවසන් වී තිබුනත් ගල් කොරි එන්න එන්නම වැඩි වී තිබෙනවා මිස නැවතී නැහැ. තවදුරටත් මෙවැනි ගල් කොරි ස්ථාපිත කල විට සිදුවන්නේ ප්‍රදේශයේ ජන ජීවිතයට ගැටළු ඇති වීමයි . මේ තුලින් ගම තුල සිටින මහජන නියෝජිතයින්ටත් ගැටළු රැසකට මුහුණ දීමට සිදුවෙනවා. ඒ අනුව මෙම ගල් කොරිය ස්ථාපිත කිරීමට මහජන මන්ත්‍රීවරුන් වශයෙන් අපි සියළු දෙනා විරෝධය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අපේ පරිසර නිලධාරීනුත් සඳහන් කර තිබෙන්නේ විශාල මහජන විරෝධතාවයක් මෙයට එල්ල වන බවයි. ඔබතුමන්ලගේ ප්‍රකාශ වලිනුත් එයට විරුද්ධ බව තහවුරු වුනා. ඒ අනුව මෙම ගල් කොරිය ස්ථාපිත කිරීමට විරුද්ධ බව දන්වා යවමු.

ඒ අනුව මෙම කළු ගල් ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභා මාර්ගය භාවිතා කිරීම සම්බන්ධයෙන් සභාවෙ විරෝධතාවය අදාළ පාර්ශවයට දැනුම් දීමට තීරණය විය.

**<u>(05-21) ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 21 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ නිවාසාධාර ලබා දීමේදී දැනට පවතින රු. 25,000.00 ක මුදල ඉක්මවා යන බවත් (2015.01.02 ව.ප.පා.දෙ. අංක 2015/01 දරණ චක්‍රලේඛ ප්‍රකාරව) ඒ සඳහා එම මුදල වර්තමාන තත්වය අනුව ප්‍රමාණවත් නොවන බවත් නිශ්චිත මුදලක් තීරණය කරගත යුතුව ඇත. එමෙන්ම දැනට පවතින මිල ගණන් වෙනස්වීම මත රු. 25,000.00 ක මුදල ඉක්මවා නිවාසාධාර ලබා දීමෙන් විගණනයට ද ලක්විය හැක. එම නිසා මෙම රු. 25,000.00 ක මුදල සීමාව ඉක්මවා යන බැවින් ඒ සඳහා අවශ්‍යතාවය පරිදි උපරිමය රු. 50,000.00 ක සීමාවකට යටත්ව අනුමැතිය පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ලබා ගැනීමට පලාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අවශ්‍යතාවය පරිදි උපරිමය රු. 50,000.00 ක සීමාවකට යටත්ව නිවාසාධාර ලබාදීම සඳහා අනුමැතිය පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ලබා ගැනීමට පලාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-22) ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/48 - 22 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ අලව්ව මහජන පුස්තකාලය සඳහා Photopier / Printer / Scaner එකක් මිලදී ගැනීම සඳහා කැඳවා තිබූ මිල ගණන් 2022.03.02 දින ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කරන ලදුව එහි නිර්දේශ අංක 1-2 යටතේ තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව නිර්දේශ විය. එයට අදාල තාක්ෂණික ඇගයීම් වාර්තාව ලැබී ඇති අතර මිල ගණන් ඉදිරිපත්කර ඇති ආයතන අතුරින් ඉල්ලුම් කර ඇති පිරිවිතර තෘප්ත වන අයුරින් මිල ගණන් ඉදිරිපත් කර ඇති එකම ආයතනය වන Metropoliton Technologies (Pvt) Ltd ආයතනය Offer 01 යටතේ මිල ගණන් ඉදිරිපත් කර ඇති canon imagerunner 2625i යන්ත්‍රය රු. 312,984.00 ක මුදලකට මිලදී ගැනීම සුදුසු බව එමගින් නිර්දේශ කර ඇත. ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව Metropoliton Technologies (Pvt) Ltd ආයතනය මගින් Offer 01 යටතේ canon imagerunner 2625i යන්ත්‍රය රු. 312,984.00 ක මුදලකට මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-23)** <u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/48 - 23** දරණ යෝජනාව</u>

මාබෝපිටිය සුධම්ම පෙරපාසල පිටුපස පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාවේ ප්‍රමිතීන්ට අනුකූලව සහ කොන්දේසි වලට යටත්ව සාර්ථකව නිමකර ඇති බැවින් ඒ සඳහා අදාල රු. 620,000.00 ක මුදල සීමාසහිත අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව මාබෝපිටිය සුධම්ම පෙරපාසල පිටුපස පැති බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අදාල රු. 620,000.00 ක මුදල සීමාසහිත අලව්ව විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**06.** <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරිම</u>

**(06.1)** - පහළ නුගවෙල සුනිල් මහතාගේ නිවස සිට අරන්ගල්ල නිවස දක්වා පැතිබැම්ම ඉදිකිරීම - රු. 150,000.00

**(06.2)** - වඩුවාව බඹරගල පාර දූම්මලදෙණිය වත්ත පාර බොරළු ඇතිරීම - රු. 100,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, ඉහත සංවර්ධන කටයුතු වලට අදාල ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

<u>**07.**නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම ඒකමතිකව සහා සම්මත විය.

**<u>08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**<u>(08.1) මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.03.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.03.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.03.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.2)කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.02.23දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.02.23 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.02.23 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.3)නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**
**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2022.02.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.02.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.
ඒ අනුව, 2022.02.23 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.4)පරිසර හා පොදුපහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.02.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.02.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.02.23 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.5)ඝන අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.02.23 දින පැවති ඝන අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2022.02.23 දින පැවති ඝන අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2022.02.23 දින පැවති ඝන අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව හා ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කිරීම**

**9.1. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා .

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**9.2. ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 පෙබරවාරි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම**

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,කාර්මික සේවා කාරක සභා වාර්තාවේ සඳහන් වන පරිදි යටිගල්ඔළුව තිලකරත්න මාවත සංවර්ධනය කිරීම සඳහා රු. 500,000.00 ක මුදලක් වෙන් කර තිබෙනවා. මෙම මාර්ගයේ ගමන් කිරීමට අපහසු බව පවසා බොරළු කියුබ් දෙකක් මාර්ගයට දමා දෙන ලෙස මගෙන් ඉල්ලීමක් කලා. ඒ අනුව මෙම මාර්ගයට බොරළු ටිපර් දෙකක් හොඳටම ප්‍රමාණවත් වෙනවා. මෙම මාර්ගයේ කෙටි දුරක් කොන්ක්‍රීට් දැමීමට සහ පැති බැම්මක් ඉදි කිරීමට මම යෝජනා කර යවා තිබෙනවා. එම නිසා මෙසේ බොරළු දැමීම එලක් වන්නේ නැහැ. කෙසේ වෙතත් ඒ සඳහා මගේ විරෝධතාවයකුත් නැහැ.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ඔබතුමාගේත් මෙම පුද්ගලයාගේත් ඉල්ලීම පරිදි අසාධ්‍ය තත්වයේ සිටින දරුණු පිළිකා රෝගියෙක් නිසාත් පැති බැම්මක් බැඳ කොන්ක්‍රීට් කරන තුරු මොහු ජීවතුන් අතර සිටීද යන ප්‍රශ්නයත් නිසා බොරළු ටිකක් හෝ දමා මාර්ගය සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කලා. ඒ අනුව කාර්මික නිලධාරීතුමා පරීක්ෂා කර බැලීමෙන් අනතුරුවයි මෙම වාර්තාව සකස් කලේ. කෙසේ වෙතත් මේ පිළිබඳව කාර්මික නිලධාරීතුමා සමඟ නැවත සාකච්ඡා කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

මෙම තිලකරත්න මාවත සංවර්ධනය කර දෙන ලෙස අපිටත් ඉල්ලීම් ඉදිරිපත් වුනා. උප සභාපතිතුමාගේ කොට්ඨාශය නිසා මට මැදිහත්වීමට නොහැකි බැවින් ලේකම්තුමියට ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කරන ලෙස මම පැවසුවා. මරණාසන්නව සිටින මෙම පුද්ගලයාගේ ඉල්ලීම පරිදි හැකි ඉක්මනින් මෙම මාර්ගය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරිමට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී කාර්මික නිලධාරීතුමා විසින් අදාල කාරණය පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභාව උපතේ සිට මරණය දක්වා සේවය කරන ආයතනයක් ලෙස අකාලයේ සිදුවන මරණයක් වලක්වා ගත හැකි නම් එය විශාල සේවයක්. මෙම බල ප්‍රදේශයේ මෙම කෙටි කාලය තුල එවැනි අකල් මරණ කිහිපයක්ම සිදු වුනා. එක් දරුවෙක් දඹදෙණිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන විට රෝහල් කාර්ය මණ්ඩලයේ අකර්මණ්‍යතාවය නිසා මාස දෙක හමාරක් යනතුරු එම දරුවාගේ සුසුම්නාව කැඩී ඇති බව දැනගත්තේ නැහැ. එමෙන්ම අපේ ප්‍රදේශයේ කුඩා දරුවෙකුගේ අභාවයක් සිදු වුනා. ඊට හේතුව වශයෙන් යම් යම් මත ප්‍රකාශ වුනා. දඹදෙණිය රෝහලේ රෝහල් කාර්ය මණ්ඩලයේ නොසැලකිල්ල හේතුකොටගෙන රෝගය හඳුනාගැනීමට නොහැකිව නිසි ප්‍රතිකාර ලබාදීමට නොහැකිවීමෙන් එම මරණය සිදු වී තිබෙනවා. මේ සම්බන්ධව අපිට සභාවක් ලෙස යම් මැදිහත්වීමක් කිරීමට හැකිනම් එය විශාල සේවයක් වේවි. නීතිය ක්‍රියාත්මක කරන ආයතනයකට මේ පිළිබඳව දැනුවත් කොට එයට අපක්ෂපාතී පරීක්ෂණයක් පවත්වා යම්කිසි අසාධාරණයක් සිදු වී තිබෙනවා නම් ඒ වෙනුවෙන් සාධාරණය ඉටු කිරීම අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කරන විශාල සේවයක් වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ෂෙල්ටන් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට අපේ ප්‍රදේශයේ ඉතා කණගාටුදායක මරණයක් සිදුවුනා. එම මරණයට හේතුව මේ වන තෙක් තහවුරු කරගෙන නැහැ. කාගෙන් සිදුවූ අතපසුතාවයක් මත එය සිදු වුනාද යන්න තහවුරු කරගෙන නැහැ. රෝහල් කාර්ය මණ්ඩලයේ අකර්මණ්‍යතාවය බොහෝ දුරට බලපාන්නට ඇති බව අදහස වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් සාධාරණයක් ඉටු කර දිය හැකි නම් එවැනි අකල් මරණ ඉදිරියට සිදු වීම වැලකේවි.

බෝයවලාන නගරයේ වැසිකිළි පද්ධතියටත් පුස්තකාලයටත් ජලය සැපයීම බොහොම අඩපණ වී තිබෙනවා. වහාම එම අඩුපාඩුව සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම නැවත ස්ථාපිත කල කැප්පිටිවලාන උප කාර්යාලයේ බොහෝ අඩුපාඩු තිබෙනවා. ඒ සඳහා වියදම් කර තිබෙන මුදල් ප්‍රමාණය දෙස බැලූ විට විශාල අකටයුතුකම් සිදු වී තිබෙන බව පෙනෙනවා. එහි සේවකයින් එකදු විදුලි පංකාවක් නොමැතිව බොහෝ අපහසුතාවයෙන් සිටිනවා. එමෙන්ම ඔවුන්ට ජලය නොමැති ලක්ෂ 10 ක් වියදම් කර ළිඳක් සකස් කර තිබුනත් එහි ජලය නොමැතියි. ඒවාට යම් ප්‍රතිකර්මයක් සිදු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. උප කාර්යාලයේ ගේට්ටුව අසල සේදී යාම නිසා වාහනයක් ගැනීමටත් අපහසුයි. එය ද සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
ජයතිලක මන්ත්‍රීතුමා ඒ පිළිබඳව දැනුවත් කිරීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. ඇතැම් අඩුපාඩු පිළිබඳව ඔවුන් අපිව දැනුවත් කර නැහැ. අපිව දැනුවත් කලා නම් පිළියම් යෙදීමට කටයුතු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පසුගිය දිනක කැප්පිටිවලාන උප කාර්යාලයට ගිය අවස්ථාවේදී ඔවුන්ට උග්‍ර ජල ප්‍රශ්නයක් ඇති බව පැවසුවා. එමෙන්ම උප කාර්යාලයට ප්‍රවිශ්ය වන මාර්ගයේ තිබෙන අඩුපාඩු ආදී ගැටළු සියල්ල මම ලිඛිතව ඉදිරිපත් කර තිබෙනවා. මෙම අඩුපාඩු සකස් කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
මෙම උප කාර්යාල දෙකේම අඩුපාඩු බොහොමයක් තිබෙනවා. ඉතා ඉක්මනින් මෙම අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරමින් සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**
ගරු සභාපතිතුමියනි, ගිය සභා වාරයේදී මගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක් පිළිබඳව ජයන්ත දිසානායක මාධ්‍යවේදී මහතා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එනම් මා ඔය කෙටේවත්ත මංකඩ අධිවේගී මාර්ගයේ මා ඔය පාලමට යටින් පිහිටි මා ඔය හරහා දැනට ඉදි කර ඇති පැන්නුම පාලමක් බවට පත්කිරීමයි. මෙම පාලම සම්බන්ධව අපි මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව එතුමා දැනුවත් නැතුව ඇති. මෙම පාලම සම්බන්ධයෙන් ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා හරහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන දැන් එය ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, සහෝදර මාධ්‍යවේදියෙක් වශයෙන් ජනතාවගේ ඉල්ලීමක් ලෙස ජයන්ත දිසානායක මහතා මෙම ඉල්ලීම ඉදිරිපත් කරන්නට ඇති.

අලව්ව නගර සංවර්ධන කටයුත්තේදී විදුලි කණු සිටුවීම සහ ජලනළ එලීමේ කටයුතු ඔබතුමියගේ මැදිහත්වීමෙන් නගරයේ ව්‍යාපාරික ජනතාවට අගතියක් නොවන ආකාරයට සිදුකලා. ඒ පිළිබඳව ඔබතුමියට ගෞරවනීය ස්තූතිය පුද කරනවා.

මේ වන විට පවතින දැඩි පැවිල්ලත් සමඟ විශාල දූවිල්ලක් මැද නගරයේ කටයුතු කිරීමට සිදු වී තිබෙනවා. සිංහල අවුරුදු සමයත් එන නිසා ඒ පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමුකර කටයුතුකරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම ගිය සභා වාරයේදී අපි කතා කල කඩ කාමර 5 ප්‍රශ්නයත් විසඳුනා. ඒ වෙනුවෙන් මෙම සභාවට ස්තූතිය පුද කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව මහජන පුස්තකාලයකට පුවත්පත් ලැබෙන්නේ ප්‍රමාද වෙලයි. මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

අපොස උසස් පෙළ විභාගය පවතිද්දී ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා පිටිය සංගීත ප්‍රසංග දෙකක් සඳහා ප්‍රාදේශීය සභාව විසින් ලබා දී තිබෙනවා. ඒ පිළිබඳව මගේ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා.

අග්බෝව ක්‍රීඩාපිටිය සහිත භූමියේ ක්‍රීඩා පිටියට පහළින් කප්රුක සමිතිය නමින් හැඳින්වෙන ගොඩනැගිල්ලක් සහ භූමියක් තිබෙනවා. එය දැන් වල් බිහි වී තිබෙනවා. එම ස්ථානයේ දෙමහල් ගොඩනැගිල්ලක් සහ ගබඩා පහසුකම් සහිත කොටසක් තිබෙනවා. මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එය බදු දී තිබෙනවා. මෙම ගොඩනැගිලි ප්‍රයෝජනයක් නොගෙන දිරාපත් වෙමින් පවතිනවා. මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ කටයුතු කරන රාජ්‍ය සේවකයින් හතර දෙනා සිටින්නේ ස්ථාන හතරකයි. සේවා පියස හදන තුරු මෙම ස්ථානයේ

ඔවුන්ගේ කාර්යාල ස්ථාපිත කර ගැනීමෙන් රජයට වියදමකුත් ඉතිරි වෙනවා. එසේ නොවන්නේ නම් සභාව මැදිහත් වී සභාවේ කටයුතු සඳහා මෙම ගොඩනැගිල්ල ලබා ගත හැකියි.

සභා වාර කිහිපයකදීම මා ප්‍රකාශ කල කෙත් සිසිල වෙන්දේසි ඉඩම පිළිබඳව ගනු ලැබූ පියවර සම්බන්ධයෙන් දැනගැනීමට කැමතියි. එමෙන්ම ජල මාර්ගයක් අවහිර වීම පිළිබඳ ලිපියක් මා ඉදිරිපත් කලා. එයට මේ වන තෙක් විසඳුමක් ලැබී නැහැ.

සභාවේ මැදිහත්වීමෙන් අපේ ප්‍රදේශය තුල යම් කිසි කටයුත්තක් සිදු කිරීමේදී ඔබතුමිය කැමති නම් පමණක් මාවත් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා. මොකද මෙම සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් එවැනි අවස්ථාවකදී අපි අපහසුතාවයට පත් වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මම මන්ත්‍රීතුමන්ලා අපහසුතාවයට පත්වෙන ලෙස කටයුතු කරන්නේ නෑ. ඇතැම් අවස්ථාවලදී හදිසියේ ඉල්ලීමක් කල විට ඒවාට සහයෝගය ලබා දීමට සිදු වෙනවා. හැකි සෑම අවස්ථාවකදීම එවැනි කටයුත්තකදී අපි ඔබතුමන්ලාව දැනුවත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,මෙසේ සාමකාමීව මේ සභාවේ සෑම මන්ත්‍රීවරයෙක්ටම කතා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳ ඔබතුමියට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. පන්නල ග්‍රාම සේවා වසමේ ගැහැනු ලමුන් තිදෙනෙක් සිටින පවුලකට සමෘද්ධි සංගමය හරහා නිවසක්තනා දීමට මුදලක් මා විසින් ලබා ගත්තා. මෙම නිවස සෑදීම සඳහා අපි විසින් අත්තිවාරම කපාදිය යුතුයි. ඒ සඳහා සභාවේ JCB යන්ත්‍රය කඩිනමින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ තීරණ අංක 12 යටතේ වහලය ඉදිකර ගැනීම සඳහා රු. 25,000.00 ක තහඩු ලබා දීම ලෙස සඳහන් වී තිබෙනවා. නමුත් මෙම පුද්ගලයා ඉල්ලා සිටින්නේ සති පොලෙන් ගලවන ලද ඇස්බැස්ටස් ශීට් ටිකක් ලබා දෙන ලෙසයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය සභාවේ 2022 අයවැය යටතේ මන්ත්‍රීවරයෙකුට වෙන් කල රු. ලක්ෂ 5 ක මුදල සඳහා සංවර්ධන කටයුතු දියත් කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු කඩිනමින් සකස් කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය ආපදා තත්වය යටතේ හානියට පත්වූ මාර්ග 17 ක් පිළිබඳ තොරතුරු මා විසින් ලබා දී තිබෙනවා. නමුත් මේ වන තුරු එම මාර්ග යථා තත්වයට පත් කිරීමට කටයුතු කර නැහැ. එම මාර්ග සකස් කර ගැනීම සඳහා ඉදිරියේදී මෝටර් ග්‍රේඩරය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මෝටර් ග්‍රේඩරය අවශ්‍ය මන්ත්‍රීතුමන්ලා ලිඛිතව ඉල්ලීම් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, හුම්බුළුව අලවලාකොටුව සිට මාර්ගය අඩි 16 ක පළලට ගැසට් පත්‍රයේ සඳහන් වී තිබුනත් මේ වන විට එම මාර්ගය අඩි 7 ක් 8 ක් වැනි ප්‍රමාණයකට අඩු වී තිබෙනවා. මෙම මාර්ගය මැනුම් කටයුතු කර දෙනවා නම් අපිට කුමක් හෝ ප්‍රතිපාදනයක් යොදා සංවර්ධනය කරගත හැකියි.

එමෙන්ම වැඩ ලක්ෂයේ ව්‍යාපෘති වල ඇස්තමේන්තු සකස් කර අවසන් දැයි දැනගැනීමට කැමතියි. එම කටයුතු කඩිනමින් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අපේ සභාවේ කාර්මික නිලධාරී මහතුන් සිටින්නේ තිදෙනෙකු පමණයි. ඔවුන්ට බලප්‍රදේශයේ පැමිණිලි විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වෙනවා. එමෙන්ම විදුලි අර්බුදය ආදිය නිසාත් ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වී තිබෙනවා. නමුත් අපි මේ වන විට ඇස්තමේන්තු 35 ක් සකස්කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා තිබෙනවා. නමුත් ඒවාටත් මේ වන තුරුත් පිළිතුරක් ලැබී නෑ.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්,ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 3.30 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/03/08
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.